# ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

# වාර්ෂික වාර්තාව

# 2014

NGJA/6/Annual Report/2014 26.11.2015

ගරු පරිසර හා පුනර්ජනනීය බල ශක්ති අමාත්‍යතුමා
පරිසර හා පුනර්ජනනීය බල ශක්ති අමාත්‍යාංශය
82,"සම්පත් පාය"
රජමල්වත්ත පාර
බත්තරමුල්ල.

ගරු ඇමතිතුමනි තුමනි,

<u>2014 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව</u>

1993 අංක 50 දරණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පනතේ 32 (3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) වගන්තිය අනුව පහත සඳහන් ලේඛන ඔබතුමා වෙත ගෞරවයෙන් ඉදිරිපත් කරමි.

1. 2014 වර්ෂය සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පාලන වාර්තාව.
2. විගණකාධිපති විසින් නිසි ලෙස විගණනය කරන ලද 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ ලාභා ලාභ ගිණුම හා 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය
3. විගණකාධිපති වාර්තාව

ස්තුතියි
ඔබේ හිතවත්

**අසංක වෙලගෙදර**
සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

# දැක්ම

ශ්‍රී ලංකාව නිල් මැණික් සඳහා ලොව පුරෝගාමියා මෙන්ම අනෙකුත් කුරුවින්ද මැණික් හා ඉහල ප්‍රමිතීයෙන් යුත් ආභරණවලට කලාපීය මධ්‍යස්ථානය බවට පත්කිරීම.

# මෙහෙවර

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ප්‍රවර්ධනය හා සංවර්ධනය උදෙසා පවත්නා සම්පත් උපරිම ප්‍රයෝජනයට ගනිමින්, ප්‍රශස්ත මට්ටමින් පහසුකම් ලබා දෙමින් නවීන තාක්ෂණය උපයෝගී කොටගෙන විශ්වාසයි තත්ත්ව සහතිකරණ පද්ධතියක් තුල තිරසාර සංවර්ධනයක් ළගාකර ගනිමින් අපගේ පාර්ශවකරුවන් වෙත ප්‍රතිලාභ සාධාරණව බෙදාහැරීම.

# මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය - 2014 වර්ෂය

| | | | පත්වූ දිනය | විශ්‍රාම ගත්දිනය |
|---|---|---|---|---|
| 1 | අමිත ගමගේ මහතා | සභාපති | 17.04.2013 | |
| 2 | ටී.කේ.එන්.සී. තියඹරාවත්ත මහතා | සාමාජික | 17.04.2013 | |
| 3 | ඩී. එම්. රූපසිංහ මහතා | සාමාජික | 25.07.2014 | |
| 4 | ඒ.කේ. සෙනෙවිරත්න මහතා | සාමාජික | 30.04.2013 | |
| 5 | චන්ද්‍රා ඒකනායක මෙනෙවිය | සාමාජික | 30.04.2013 | |
| 6 | ජගත් විජේවීර මහතා | සාමාජික | 29.01.2014 | |
| 7 | ටී. එම්. සිරිසෝම මහතා | සාමාජික | 17.04.2013 | |
| 8 | අර්මිල සමුන් මහතා | සාමාජික | 17.04.2013 | |
| 9 | ආර්.ඩී.එස්. මුණසිංහ මහතා | සාමාජික | 06.05.2013 | |
| 10 | එස්.එම්.එන්. ලලිත් සේනානායක මහතා | සාමාජික | 06.05.2013 | |
| 11 | බන්දුල එගොඩගේ මහතා | සාමාජික | 26.06.2013 | |
| 12 | අරුණ ලේකම්ගේ මහතා | සාමාජික | 17.04..2013 | 21.07.2014 |
| 13 | පී.එච්.ඕ. චන්ද්‍රවංශ මහතා | සාමාජික | 30.04.2013 | 10.06.2014 |
| 14 | වෛද්‍ය ඩබ්.එල්.ඩී.ආර්. ඒ.කරුණාතිලක මහතා | සාමාජික | 30.04.2013 | 14.01.2014 |

# 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය යටතේ 2014 වසර සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පාලන වාර්තාව

**01.** 2014 වසර ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 20 වන වසර සනිටුහන් කරයි. සමාලෝචිත වර්ෂය තුල එහි කාර්ය භාරය මෙහෙයවන ලද්දේ රත්නපුර පිහිටි ප්‍රධාන කාර්යාලය හා කොළඹ කාර්යාලය සහ රත්නපුරය, ඇහැලියගොඩ, මාතර, නාවුල සහ මොණරාගල ප්‍රාදේශීය ඒකක මෙන්ම කටුනායක මැණික් අපනයන මධ්‍යස්ථානය සහ ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ පිහිටුවා ඇති මැණික් හා ස්වර්ණාභරණ හුවමාරු මධ්‍යස්ථානය මගිනි.

**02.** අධිකාරියේ කර්තව්‍යයන්

(අ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම;

(ආ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා යෝජනා ක්‍රම ආරම්භ කර ක්‍රියාත්මක කිරීම;

(ඇ) ශ්‍රී ලංකාව ඇතුලත හෝ ඉන් පිටත හෝ මැණික් හා ස්වර්ණාභරණ සඳහා වූ වෙළඳපොළ පුළුල් කිරීම සහ මැණික් හා ස්වර්ණාභරණ සඳහා ලෝක වෙළඳ පොලේ ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම;

(ඈ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය දියුණු කිරීමේ අදහසින් එම කර්මාන්තවලට අදාල සෑම අංශයකම සේවක පිරිස් වලට කාර්මික පුහුණුව, විශේෂයෙන් තාපයෝජනය සහ මැණික් කැපීම පිළිබඳව පුහුණුව ප්‍රවර්ධනය කිරීම සහ ඊට අනුග්‍රහය දැක්වීම;

(ඉ) අනාගත ගැණුම් කරුවන් තුල මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය කෙරෙහි විශ්වාසය ඇති කිරීමට අවශ්‍ය වියහැකි පියවරයන් ගැනීම;

(ඊ) නීති විරෝධි මැණික් ගැරීම සහ නීති විරෝධි ලෙස මැණික් ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීම වැලැක්වීම;

(උ) පතල් කැණීමේ හෝ මැණික් ගැරීමේ අයිතිවාසිකම් යම් ආරක්ෂා කිරීමක් හේතුවෙන් හෝ අන්‍යාකාරයකින් රජය වෙත රඳී ඇති අවස්ථාවල රජයේ ඉඩම්වල හෝ ඒ මත හෝ රජය විසින් හෝ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් බැහැර කරන ලද ඉඩම්වල හෝ ඒ මත මැණික් පතල් කැණීමේ අයිතිවාසිකම් අන්සතු කරදීම පිළිබඳව වගකිවයුතු එකම බලධරයා වශයෙන් ක්‍රියා කිරීම;

(ඌ) මැණික් හා ස්වර්ණාභරණ අලෙවි කිරීමට අවශ්‍ය කාර්මික සහ වෙනත් උපදෙස් සහ යටිතල පහසුකම් සැපයීම;

(එ) යම් උපලේඛන ගත ලිඛිත නීතියක්

i එය මැණික් හෝ මැණික් කර්මාන්තය සම්බන්ධයෙන් අදාල වනතාක් දුරට,

ii මේ පනත යටතේ අධිකාරියේ බලතල. කර්තව්‍ය සහ කාර්යය අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනතාක් දුරට එම නීතියේ කාර්ය පරිපාලනය කිරීම;

(ඒ) මැණික් සහ වටිනා ලෝහ වර්ග සහතික කිරීම සඳහා කාර්යාල පිහිටුවීම

(ඔ) නිෂ්පාදිතයකුගේ ඉල්ලීම පිට, සපයනු ලබන ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත ස්වර්ණාභරණ නියමිත ආකාරයකට විශේෂ ලකුණකින් මුද්‍රා තබන බවට වගබලා ගැනීම;

(ඕ) ශ්‍රී ලංකාවේ මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා මැණික් කර්මාන්තය, ස්වර්ණාභරණ කර්මාන්තය සහ රජයේ දෙපාර්තමේන්තු අතර මනා සම්බන්ධීකරණයක් ගොඩනැගුම හා එම සම්බන්ධීකරණයක් ගොඩනැගීම හා එම සම්බන්ධීකරණ ක්‍රියාදාමයන් තවදුරටත් වර්ධනය කිරීමේ අතරමැදියා වශයෙන් කටයුතු කිරීම;

(ක) මැණික් කර්මාන්තයේ සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ සේවා නියුක්තයන්ගේ සේවා නියුක්ති නියමයන් සහ කොන්දේසි සහ විශේෂයෙන් එම තැනැත්තන්ගේ ජීවිත සහ ශරීරාංග අනතුරු වලින් ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවරයන් ගැනීම සහ ඒවා විධිමත් කිරීම සහ පාලනය කිරීම

## 03. <u>මූල්‍යය</u>

### 3.1 **ද්‍රවශීලතාවය :**

වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ රුපියල් මිලියන 97.964 ක්වූ අතර වසර අවසානයේදී එය රුපියල් මිලියන 43.548ක් විය. කල්පිරීමේ ආයෝජන (භාණ්ඩාගාර බිල්පත්) වල වසර ආරම්භයේදි රුපියල් මිලියන 216.381ක් වූ අතර එය වසර අවසානයේදී රුපියල් මිලියන 482.640ක් විය.

වර්ෂය ආරම්භයේදී අනිකුත් මූල්‍ය වත්කම් වටිනාකම රුපියල් මිලියන 639.376ක් වූ අතර වසර අවසානයේදී එය රුපියල් මිලියන 754.132ක් විය.

### 3.2 **ලාභදායකත්වය :**

| | **2009**<br>රුපි.මිලි. | **2010**<br>රුපි.මිලි. | **2011**<br>රුපි.මිලි. | **2012**<br>රුපි.මිලි. | **2013**<br>රුපි.මිලි. | **2014**<br>රුපි.මිලි. |
|---|---|---|---|---|---|---|
| මුළු අදායම | 219.443 | 228.962 | 250.300 | 612.004 | 507.542 | 679.815 |
| මුළු වියදම | 230.942 | 261.929 | 222.488 | 261.076 | 387.458 | 364.873 |
| ලාභය(බදුවලටපෙර) | **(11.498)** | **(32.967)** | **27.812** | **350.928** | **120.084** | **314.942** |

**04.** **මානව සම්පත්:**

2014 වසර අවසානයේදී අධිකාරියෙහි කාර්ය මණ්ඩලය වෘත්තිකයන්ද ඇතුළුව 278 දක්වා ලගාවිය. අප කන්ඩායමේ සාමාජිකයන්ගේ අඛන්ඩ වෘත්තීයමය සංවර්ධනය ඉහල ප්‍රමුඛස්ථානයේලා සලකනු ලබන අතර. මානව සම්පත් සංවර්ධනය කිරීමට අවස්ථා සලසාදීම අරහයා පියවර කිහිපයක් ගනු ලැබුණි.

**05.** **බලපත්‍ර නිකුත් කිරීම :**

මැණික් කර්මාන්තය සඳහා අධිකාරියෙහි කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් සහ ප්‍රාදේශීය කාර්යාල මගින් නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව පසුගිය වසර පහක සංඛ්‍යා සමග සසඳා පහත දැක්වේ.

| | **2009** | **2010** | **2011** | **2012** | **2013** | **2014** |
|---|---|---|---|---|---|---|
| මැණික් ගැරීමේ බලපත්‍ර | 3,970 | 4,061 | 4,687 | 5,956 | 6,565 | 5,928 |
| මැණිත් වෙළඳ බලපත්‍ර | 4,036 | 4,195 | 4,422 | 4,382 | 4,429 | 4.714 |
| මැණික් කැපීමේ බලපත්‍ර | 174 | 168 | 179 | 177 | 192 | 199 |
| මැණික් වෙන්දේසි බලපත්‍ර | 217 | 262 | 277 | 364 | 624 | 578 |
| බලපත්‍ර එකතුව | **8,357** | **8,686** | **9,565** | **10,879** | **11,810** | **11,419** |

06. **අනවසර මැණික් ගැරීම් සහ පාරිසරික හාණි පාලනය :**

අනවසර මැණික් ගැරීම් සහ ඒ තුලින් සිදුවන පාරිසරික විනාශයන් මැඩ පැවැත්වීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී අධිකාරියෙහි නිලධාරීන් වැටලීම් ගණනාවක් සිදු කරන ලදී. සමථ ගාස්තු තුලින් රුපියල් මිලියන 12.182 ක් උපයා ගන්නා ලදී. අත් හැරදමා තිබු මැණික් පතල් වසා දැමීමට හා හාණියටපත් ගංගා ඉවුරු පුනරුත්ථාපනය කිරීමට අධිකාරිය විසින් පියවර ගන්නා ලදී.

07. **විශේෂ මැණික් ගැරීම් ව්‍යාපෘති**

වර්ෂය තුළදී විශේෂ මැණික් ගැරීම් ව්‍යාපෘති පහක් සිදු කල අතර මෙම ප්‍රදේශ බහුලව අනවසර මැණික් ගැරීම් වලට භාජනය වන පරිසර සංවේදී කළාපයන් වල පිහිටා තිබීම විශේෂ ලක්ෂණයකි.
මෙම ව්‍යාපෘති එල්ලාවල ගඟ, බලංගොඩ වැලි හැරණ, සීතාවක අදියර I, හැරණියාවක හා සීතාවක අදියර ii, වශයෙන් හඳුන්වා දිය හැකි අතර එමගින් රු. මිලියන 228 ක ආදායමක් උපයා ගත හැකි විය.

08. **සේවා සහ අනිකුත් සංවර්ධන කාර්යයන්:**

**8.1** <u>අපනයන හා අපනයන සංවර්ධනය.</u>

1. පහත සඳහන් තෝරාගත් ජාත්‍යන්තර වෙළඳපොලවල් සහ ප්‍රදර්ශන යන්හීදී "ශ්‍රී ලංකා මණ්ඩපය" සඳහා අනුග්‍රහය දැක්වීම සහ සංවිධානය කිරීම

i. HKTDC ෂැංහයි ජාත්‍යන්තර දියමන්ති, මැණික් සහ මුතු - මාර්තු 3 සිට 7 දක්වා

ii. ෂැංහයි ස්වර්ණාභරණ ප්‍රදර්ශන මැයි 8 සිට 12 දක්වා

iii. ලාස් වේගාස් JCK ප්‍රදර්ශනය මැයි 30 සිට ජුනි 2

iv. සිංගප්පූරුවේ ජාත්‍යන්තර ස්වර්ණාභරණ ප්‍රදර්ශනය - ජුලි 3සිට 6

v. ලන්ඩන් ජාත්‍යයන්තර ස්වර්ණාභරණ - අගෝසතු 31 සිට සැප්තැම්බර් 2

vi. හොංකොං ජාත්‍යන්තර මැණික් ප්‍රදර්ශනය සැප්තැම්බර් 15 සිට 19

vii. චීන ජාත්‍යන්තර රත්තරන්, ස්වර්ණාභරණ හා මැණික් වෙළඳ පොළ නොවැම්බර් 6 සිට 9 දක්වා

viii. චීන ජාත්‍යන්තර ස්වර්ණාභරණ ප්‍රදර්ශනය නොවැම්බර් 13 සිට 17

2. මැණික් හා ස්වර්ණාභරණ අංශයේ සහභාගීත්වයෙන් පහත සඳහන් අවස්ථාවන් සංවිධානය කිරීම

    i. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සංවිධානය කරන ලද දකුණු ආසියානු මහා වෙළඳ පොළ
    ii. ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය සංවිධානය කරන ලද මුම්බායි ප්‍රර්ධන වැඩ සටහන

3. දේශීය වෙළඳ පොලවල් සහ ප්‍රදර්ශන සඳහා "ජා.මැ.ස්.අ.මණ්ඩපය " මගින් සංවිධානය හා අනුග්‍රහය දැක්වීම

    i. සෙන්කඩගල සූර්ය උදානය - අප්‍රේල් 4 සිට 7
    ii. ජාතික වාණිජ මණ්ඩලය මගින් මෙහෙයවන ලද "Inter – Expo සහ ආරෝග්‍යා 2014 ප්‍රර්ශනය"
    iii. 24 වන ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය - “ෆැසට් (FACET) ශ්‍රී ලංකා 2014 “ සැප්තැම්බර් 4 සිට 7
    iv. රත්තරන් ගිණි සිළුව සම්මානය 2014 සැප්තැම්බර් - 16 සිට 17
    v. අලවුපුර නවෝදය ඔක්තෝබර් - 3 සිට 7
    vi. ආසිය BAQ සම්මේලනය සහ EST වැඩසටහන නොවැම්බර් -19 සිට 21
    vii. ශ්‍රී ලංකා මැණික් විද්‍යාඥයින්ගේ සංගමය මගින් මෙහෙයවන ලද “ජුවෙල්ස් 2014” දෙසැම්බර් - 19 සිට 22

4. මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රජාවට ඔවුන්ගේ යන්ත්‍ර උපකරණ සහ අමුද්‍රව්‍ය මිලදී ගැනීමේදී අවශ්‍ය විදේශ ව්‍යවහාර මුදල් ( ඇමරිකන්ඩොලර් 50,000 ටඅඩු ) නිර්දේශ ලිපි නිකුත් කිරීම සහ මෙහෙයවීම.

5. මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ යෙදෙන විදේශීය ව්‍යාපාරික ආයතන සහ පුද්ගලයින්ගේ ඉල්ලීම මත ඔවුනට ශ්‍රී ලංකාවේ රැදී සිටීමට අවශ්‍ය වීසා ලබාගැනීමට සහ වීසා අලුත් කරවා ගැනීමට නිර්දේශිත ලිපි අදාල අමාත්‍යාංශය වෙත නිකුත් කිරීම.

6. ශ්‍රී ලාංකික මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ නියුතු වුවන්හට වීසා ලබා ගැනීමේ ක්‍රියාවලියේදී අදාල රටවල් වල වීසා නිලධාරීන් වෙත වීසා ලිපි නිකුත් කිරීම.

7. **www.ngja.gov.lk** නමින්අන්තර් ජාල වෙබ් අඩවියක් පවත්වාගෙන යාම.

8. ශ්‍රී ලංකාව තුල රාජ්‍ය අනුග්‍රහය මත පවත්වාගෙන යනු ලබන මැණික් සහ ස්වර්ණාභරණ වෙළඳ සංකීර්ණ "ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ හුවමාරුව" මගින් පහසුකම් සැපයීම සහ ප්‍රවර්ධනය කිරීම.

9. කුඩා හා මධ්‍යම පරිමාණ ස්වර්ණාභරණ නිෂ්පාදකයන් පදනම් කරගෙන ස්වර්ණාභරණ නිෂ්පාදන ආයුධ සහ උපකරන නිකුත් කිරීම.

10. ස්වර්ණාභරණ කර්මාන්තයේ නව ප්‍රවණතා සහ සම්මතයන් පිළිබදව කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයන් සදහා දැනුවත් කිරීමේ වැඩ සටහන් මෙහෙයවීම සහ සංවිධානය කිරීම.

   අ. ස්වර්ණාභරණ නිර්මාණයන් සදහා නව තාක්ෂණය i - ලියන්වෙල, මුන්වත්ත

   ආ. ස්වර්ණාභරණ නිර්මාණයන් සදහා නව තාක්ෂණය - යාපනය

   ඇ. ස්වර්ණාභරණ නිර්මාණයන් සදහා නව තාක්ෂණය - වවුනියා

   ඈ. මැණික් ගල් සැකසීමේ වැඩ සටහන - ii - ලියන්වෙල, මුන්වත්ත

   ඉ. මැණික් ගල් සැකසීමේ වැඩ සටහන - ගැටඹේ, මහනුවර

11. කුඩා සහ මධ්‍යම පරිමාණ ස්වර්ණාභරණ නිෂ්පාදකයන්හට තමන්ගේ ස්වර්ණාභරණ අයිතමයන් විකිණීමට සහ ප්‍රවර්ධනයට " රත්නදීප" වෙළඳ කුටි සහ ප්‍රදර්ශනාගාර කළමනාකරණය කිරීම සහ මෙහෙයවීම.

12. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේදී භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය, ආයුධ, යන්ත්‍ර සහ උපකරණ ආනයනය කිරීමේදී සහන බදු අනුපාතයන්යටතේ ආනයනයට සහාය වීම

13. රාජ්‍ය සහ පුද්ගලික අංශයේ මැණික්හාස්වර්ණාභරණ සම්බන්ධ නියෝජිත මණ්ඩලයන්හට ඔවුන්ගේ රාජකාරි හෝ පුද්ගලික ව්‍යාපාරික ගමන් වලදී පහසුකම් සැපයීම

09. **මැණික් හා ස්වර්ණාභරණ අපනයනය :**

පසුගිය වසර පහක සහ සමාලෝචිත 2014 වසර තුල ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ අපනයනය පිළිබද තත්ත්වය පහත දැක්වෙන සංඛ්‍යා මගින් නිරූපනය වේ**:**

| | **2009**<br>රු. මිලි. | **2010**<br>රු. මිලි. | **2011**<br>රු. මිලි. | **2012**<br>රු. මිලි. | **2013**<br>රු. මිලි. | **2014**<br>රු. මිලි. |
|---|---|---|---|---|---|---|
| මැණික් අපනයන | 7,225.8 | 7,488.6 | 10,027.6 | 14,557 | 14,805 | 19,014 |
| මැණික් - NSS විශේෂ ව්‍යාපෘතිය | | | | | 1,915 | 3,179 |
| ස්වර්ණාභරණ අපනයන | 1,522.9 | 1,490.5 | 1,732.3 | 2,444 | 2,194 | 2,467 |
| ගෙවුඩ අපනයනය | 107.7 | 136.5 | 146.7 | 225 | 122 | 140 |
| දියමන්ති ප්‍රතිඅපනයනය | 35,965.96 | 36,030.1 | 45,381.1 | 52,893 | 37,855 | 25,633 |
| දියමන්තිආභරණ අපනයනය | 417.5 | 312.5 | 375.8 | 324 | 229 | 258 |
| මුළු අපනයනය | **45,239.86** | **45,458.20** | **57.663.5** | **70,443** | **57,210** | **50,691** |

**වජිර නාරම්පනාව**

සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි

**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය** ***2015-02-27***

# ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
## දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය

ශ්‍රී ලංකා රුපියල් වලින්

| | සටහන් | 2014 | 2013 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | **3** | 236,813,268 | 227,741,261 |
| කල්බදු ඉඩම් (භාවිතයට අයිති) | **4** | 28,363 | 30,727 |
| අස්පෘශ්‍ය වත්කම් | **5** | 148,916 | 357,792 |
| අනිකුත් වත්කම් | **7** | 371,939,331 | 371,939,331 |
| විකිණිය හැකි මූල්‍ය වත්කම් | **8** | 1,200,010 | 1,200,000 |
| **ජංගම නොවන වත්කම් එකතුව** | | **610,129,887** | **601,269,111** |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | **9** | 4,141,809 | 2,160,405 |
| ලැබිය යුතු දෑ | **10** | 28,905,148 | 9,396,134 |
| කල්පිරෙන තෙක් රදවා ගත් ආයෝජන (HTM) | **11** | 482,639,856 | 216,381,558 |
| තැන්පත් සහ අත්තිකාරම් | **12** | 44,144,872 | 32,709,520 |
| සේවක ණය සහ අත්තිකාරම් | **13** | 14,108,003 | 13,659,749 |
| අනිකුත් මූල්‍ය වත්කම් | **14** | 754,132,625 | 639,376,488 |
| මුදල් සහ මුදල් සමානයන් | **15** | 43,547,995 | 97,964,396 |
| **ජංගම වත්කම් එකතුව** | | 1,371,620,308 | 1,011,648,249 |
| **මුළු වත්කම්** | | **1,981,750,195** | **1,612,917,360** |
| **ස්කන්ධ සහ බැරකම්** | | | |
| **ස්කන්ධ** | | | |
| දායක ප්‍රාග්ධනය | **16** | 30,000,000 | 30,000,000 |
| මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල | **17** | 27,365,928 | 26,927,498 |
| ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල | **18** | 37,504,763 | 29,059,263 |
| මැණික් ත්‍යාග අරමුදල | **19** | 36,033,910 | 36,511,450 |
| මැණික් ප්‍රත්‍යාගණන සංචිත | **20** | 355,074,648 | 355,074,648 |
| ප්‍රත්‍යාගණන සංචිතය | **21** | 52,945,424 | 52,945,424 |
| රදවා ගත් ඉපයුම් | | 615,579,700 | 440,155,420 |
| **ස්කන්ධඑකතුව** | | **1,154,504,374** | **970,673,703** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදියාව | **22** | 31,075,157 | 23,995,857 |
| විලම්භිත බදු බැදියාව | **6** | 16,923,372 | 18,292,344 |
| -කල් බදු ගෙවීමේ බැදියාව - පියවීමේ කාලසීමාව අවුරුද්ද ඉක්මවන | **23.1** | 10,120 | 11,680 |
| **ජංගම් නොවන බැරකම් එකතුව** | | **48,008,649** | **42,299,881** |

| | | | |
|---|---|---|---|
| **ජංගම බැරකම්** | | | |
| කල් බදු ගෙවීමේ බැදියාව - පියවීමේ කාලසීමාව අවුරුද්ද නොඉක්මවන | **23.1** | 2,230 | 2,230 |
| ගෙවිය යුතු දෑ | **24** | 103,941,946 | 64,715,858 |
| මැණික් ගැරීමේ තැන්පතු | | 369,912,429 | 326,673,784 |
| ආපසු ගෙවිය යුතු තැන්පත් සහ අත්තිකාරම් | **25** | 106,299,348 | 96,452,755 |
| ව්‍යවස්ථාපිත ගෙවීම් | **26** | 150,054,864 | 92,638,388 |
| වෙන්කිරීම් සහ උපචිත වියදම් | **27** | 49,206,356 | 19,460,760 |
| | | ---------------- | --------------- |
| **ජංගම බැරකම් එකතුව** | | **779,237,173** | **599,943,775** |
| | | --------------- | ---------------- |
| **ස්කන්ධ සහ බැරකම් එකතුව** | | **1,981,750,195** | **1,612,917,360** |
| | | ========= | ========= |

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව මෙම මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම කළමණාකාරීත්වය සතුවේ.

................................................ ................................................

**සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි** **ප්‍රධාන ගණකාධිකාරි**

................................................ ................................................

**අධ්‍යක්ෂක** **අධ්‍යක්ෂක**

**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියශ්‍රී ලංකා රුපියල් වලින්**

**2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශණය**

| | සටහන් | 2014 | 2013 |
|---|---|---|---|
| **අයභාරය** | **28** | 590,723,305 | 370,695,500 |
| **අනිකුත් ආදායම්** | **29** | 27,871,684 | 26,730,178 |
| පරිපාලන වියදම් | **30** | (136,149,399) | (126,580,200) |
| සේවක වියදම් | **31** | (172,334,751) | (130,071,227) |
| ප්‍රවර්ධන වියදම් | **32** | (56,388,916) | (30,807,746) |
| මෙහෙයුම් ලාභය | | **253,721,923** | **109,966,504** |
| ශුද්ධ මූල්‍ය ආදායම | **33** | **61,220,312** | **110,117,497** |
| ශුද්ධ මූල්‍ය ආදායමට පසු ලාභය | | **314,942,235** | **220,084,001** |
| ඒකාබද්ධ අරමුදලට දායකය | | **-** | **(100,000,000)** |
| බදුවලට පෙර ලාභය | | **314,942,235** | **120,084,001** |
| **ආදායම් බදු වියදම්** | **34** | (145,347,542) | (60,921,156) |
| වර්ෂය සඳහා ලාභය | | **169,594,693** | **59,162,845** |
| වර්ෂය සඳහා ලාභය | | **169,594,693** | **59,162,845** |
| අනිකුත් විස්තීරණ ආදායම් | | - | - |
| වරෂය සඳහා මුළු විස්තීරණ ආදායම | | **169,594,693** | **59,162,845** |

# ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

## 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

**1.** **වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය**

**1.1** **පිළියෙල කිරීමේ පදනම**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙහි ("අධිකාරිය") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතයන්ට අනුකූලව පිළියෙල කර ඇත. මූල්‍ය වත්කම් ඒවායේ ඓතිහාසික පිරිවැය, ඒවායේ විකුණුම් මත ලබා ගත හැකි සත්‍ය වටිනාකමට පරිවර්තනය කර මූල්‍ය ප්‍රකාශන පිලියෙල කර ඇත. ගිණුම් ඇස්තමේන්තු ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතයන්වල (SLFRSs) නියම කර ඇති කරුණු වලට එකගව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරේ. ගිණුම්කරණ ප්‍රමිත අදාල කර ගැනීමේ ක්‍රියාවලියේදී කළමණාකාරීත්වයේ අවශ්‍යතාවය මත තීරණයකර යොදාගැනේ. සංකීර්ණත්වයෙන් විවිධ වූ තීක්ෂණ ලෙස තීරණ ගැනීමේ කරුණු වලදී හෝ මූල්‍ය ප්‍රකාශන වලට වැදගත් වන කරුණු භාරගැනීම හෝ ඇස්තමේන්තු කිරීම ගිණුම් වල හෙළිදරව් කර ඇත.

1.2 **ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්වීම්**

අනිකුත් විදියකින් දක්වා නොමැති නම් පහත සදහන් කර ඇති ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්වීම්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වලට පරිවර්තනය කිරීම ආරම්භක දිනයට පැවති මූල්‍ය තත්ත්වය ඉදිරිපත් කරන ලද කාල පරිච්ඡේද වලට අදාලව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන වල ස්ථිරව යොදාගෙන ඇත.

මෙම වර්ෂයේදී මනාලෙස ඉදිරිපත් කිරීම සහ සැසදීමට හැකිවන පරිදී අවශ්‍ය අවස්ථා වලදී
පසුගිය වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇත.

1.3 **විදේශීය මුදල් පරිවර්තනය කිරීම**

1.3.1 **ඉදිරිපත් කරනු ලබන මුදල් වර්ගය සහ ක්‍රියාකාරීත්වය**

මූල්‍ය ප්‍රකාශයන්හී අඩංගු ගණු දෙණු සහ ශේෂයන් ආයතනය ක්‍රියාත්මක වනු ලබන මූලික ආර්ථික පරිසරයේදී භාවිතා කරනු ලබන මුදල් මත ගණනය කර ඇත. අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා රුපියල් මගින් ඉදිරිපත් කර ඇත.

1.3.2 **ගණු දෙණු සහ ශේෂයන්**

විදේශීය මුදල් ගණුදෙණු එකී ගණුදෙණුව සිදුවන අවස්ථාවේ පවතින විදේශ මුදල් හුවමාරු අනුපාතයන් භාවිතා කරමින් ක්‍රියාකාරීත්වයේ පවතින මුදල් වලට පරිවර්තනය කරනු ලැබේ. එකී ගණුදෙණු පියවීමේදී ඇතිවන විදේශ මුදල් හුවමාරු ලාභය හෝ අලාභය සහ වර්ෂය අවසානයේ පරිවර්තනයන් එදිනට පවතින විදේශ මුදල් හුවමාරු වටිනාකම මත මූල්‍ය වත්කම් සහවිදේශ මුදල් මත ඇතිවන බැදීම් විස්තීරණ ආදායම් ප්‍රකාශයන් හී හදුනාගැනේ.
ක්‍රමක්ෂය පිරිවැය වෙනස් වීම් වලට අදාල මුදල් පරිවර්තිත වෙනස්වීම් විස්තීරණ ආදායම් ප්‍රකාශන වලදී හදුනාගැනේ.

### 1.3.3 දේපල, පිරියත හා උපකරණ

කළමනාකාරීත්වය අදහස් කරන පරිදි වත්කම් යම් ස්ථානයක පිහිටුවීමට හෝ ක්‍රියාකාරීත්වයට ගෙන ඒමට දරනු ලබන සෘජුවම ආරෝපිත කල හැකි ඕනෑම පිරිවැයක් දේපල, පිරියත හා උපකරණ වල වටිනාකමට ඇතුලත්ව හඳුනාගැනේ.

1998 වර්ෂයට පෙර අත්පත්කර ගත් දේපල, පිරියත හා උපකරණ වල වටිනාකම 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මුල්‍ය තත්ත්ව ප්‍රකාශනවල ප්‍රත්‍යාගණන වටිනාකමට පිළියෙල කර ඇත. ප්‍රත්‍යාගණන වටිනාකම ප්‍රත්‍යාගණනය කරනු ලබන දිනයේදී පැවති සාධාරණ වටිනාකම ලෙස අධිකාරිය විසින් භාරගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ තීරණය කරන ලද පිරිවැය සමුච්චිත ක්ෂවීම් අඩුකිරීමෙන් පසුව හාණි පාඩු ලෙස සටහන් කරනු ලැබේ. 1998 වර්ෂයෙන් පසුව අත්පත් කර ගන්නාලද දේපළ, පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂවීම් අඩු කිරීමෙන් පසුව හාණි පාඩු ලෙස ගණනය කරනු ලැබේ.

වත්කමක් මිලදී ගැනීමෙන් පසුව දරනු ලබන පිරිවැය එම අයිතමය මගින් අධිකාරියට අනාගත ආර්ථික වාසි සමග ඒකාබද්ධව විශ්වාසයකින් ගණනය කල හැකි නම් එයද වත්කමෙහි වටිනාකම ලෙස හඳුනාගනු ලබන අතර, අනිකුත් සියළුම අලුත් වැඩියා සහ නඩත්තු සඳහා දරනු ලබන ගාස්තු එකී වියදම දරනු ලබන කාලපරිච්ඡේදයට අදාල විස්තීරණ ආදායම් ප්‍රකාශන වල දක්වනු ලැබේ.

ඉඩම් ක්ෂය නොකරනු ලබන අතර අනෙකුත් වත්කම් සරල මාර්ග ක්‍රමය මත ක්ෂය කරනු ලබන අතර පහත සඳහන් අයුරු වත්කමෙහි ඇස්තමේන්තුගත ජීව ආයුකාලය මත එහි ක්ෂයවීම් බෙදාහරිනු ලැබේ.

| **අයිතමය** | **ආයු කාලය** | **ක්ෂය අනුපාතය** |
|---|---|---|
| ගොඩනැගිලි | වසර 30 – 50 | 2% - 3.33% |
| වෙන්කිරීම් | වසර 3 | 33.33% |
| පර්යේෂණාගාර හා ස්වර්ණාභරණ පරික්ෂණ උපකරණ | වසර 10 | 10% |
| ලී බඩු සහ කාර්යාල උපකරණ | වසර 10 | 10% |
| රථ වාහන | වසර 4 | 25% |
| පරිගණක උපකරණ | වසර 5 | 20% |
| අනිකුත් වත්කම් | වසර 10 | 10% |

වත්කමෙහි ඇස්තමේන්තුගත වටිනාකමට වඩා ඉදිරියට ගෙනයනු ලබන වටිනාකම වැඩිවන්නේ නම්, වත්කමෙහි ඉදිරියට ගෙන එන වටිනාකම පියවාගත හැකි වටිනාකමට ලියා හරිනු ලැබේ.

### 1.3.4. අස්පෘශ්‍ය වත්කම්

පරිගණක වැඩ සටහන් හා පරිගණක පද්ධති අත්පත්කර ගැනීමට හා ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට ගෙන ඒම සඳහා දරනු ලබන පදනම මත පරිගණක වැඩ සටහන් හා පරිගණක පද්ධති ප්‍රාග්ධනිත කරනු ලැබ. මිලදී ගත් අස්පෘශ්‍ය වත්කම් ඒවා මිලදී ගැනීමට දරන ලද වියදමෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හාණි වූ වටිනාකම අඩුකිරීමෙන් පසු දක්වනු ලැබේ. මෙම පිරිවැය පහත සඳහන් අයුරු ඇස්තමේන්තු ගත ආයු කාලය මත ක්‍රමක්ෂය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| පරිගණක පද්ධති | වර්ෂ 5 | 20% |

පරිගණක පද්ධති නඩත්තු සඳහා දරනු ලබන පිරිවැය වියදම් වශයෙන් හඳුනා ගනු ලැබේ.

### 1.3.5. කල් බදු ඉඩම්

කල් බදු යටතේ දරනු ලබන ඉඩම් පලමුවෙන්ම බදු ගෙවීම් වටිනාකම වර්ධනය වන ණය අනුපාතයන් යටතේ වට්ටම්කර එයට ආරම්භක මුලික පිරිවැය හා ඉන් පසුව දරන්නට සිදුවන පිරිවැය එකතුකර වර්තමාන වටිනාකම සමාන වන පරිදි ගණනය කරනු ලබන අතර කල්බදු ඉඩම් ක්‍රමක්ෂය පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. කල්බදු ඉඩම් වල වටිනාකම කල් බදු කාලසීමාව තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| කල් බදු ඉඩම් | වර්ෂ 30 | 3.33% |

### 1.3.6. මූල්‍ය නොවන වත්කම් වල අගය අඩුවීම

සෑම වාර්තාකරනු ලබන කාල පරිච්චේදයක් අවසානයේදීම අධිකාරිය විසින් දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල අගය පිළිබඳ විමසා බැලෙන අතර, එම වත්කම්වල අගය අඩු වීමක් පෙන්නුම් කෙරේද යන්න තීරණය ලැබේ. එවැනි ලක්ෂණයක් පෙන්නුම් කෙරේ නම්, එම වත්කම් මගින් ආවරණය කරගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කර අගය අඩුවීම තීරණය කෙරේ.

විකුණුම් පිරිවැය වත්කමේ සාධාරණ අගයෙන් අඩු කිරීමෙන් පසු ආවරණය වන වටිනාකම වැඩි
නම් අගය භාවිතයට ගැනේ. භාවිතා කිරීමේ ඇස්තමේන්තු අගය, අනාගත අස්තමේන්තු මුදල් ප්‍රවාහ වර්තමාන මුදල් ප්‍රවාහ වර්තමාන වටිනාකම අනාගත බදු වට්ටම් අනුපාතයෙන් ගණනය කරන අතර එම මුදල් වල වර්තමාන තක්සේරු අගය හා විශේෂ අවධානම් තක්සේරු කරනු ලැබුවද එය අනාගත මුදල් ප්‍රවාහයට ගැලපීම් නොකෙරේ.

වත්කමෙහි දරනු ලබන වටිනාකම ආවරනය කරගත හැකි ඇස්තමේන්තු වටිනාකමට අඩුනම්, දරනු ලබන වටිනාකම ආවරණය කරගත හැකි වටිනාකම දක්වා වත්කමෙහි වටිනාකම අඩු කරනු ලැබේ. අගය අඩුවිමේ පාඩුව විස්තීර්ණ මුදල් ප්‍රකාශයන්හීදී හඳුනාගනු ලැබේ.

## 1.4. මූල්‍ය වත්කම්

### 1.4.1. වර්ගීකරණය

අධිකාරියෙහි මූල්‍ය වත්කම් හඳුනාගැනීම අනුව පහත සඳහන් අයුරු වර්ගීකරණය කරනු ලැබේ

i. ණය හා ලැබිය යුතු දෑ
ii. විකුණාගත හැකි දෑ (AFS)
iii. කල්පිරීම දක්වා රඳවා ගන්නා වූ ආයෝජන (HTM)

**i. ණය හා ලැබිය යුතු දෑ**

ක්‍රියාකාරි වෙළඳ පොලෙහි මිල නියම නොකරන ලද, ස්ථිර හෝ තීරණය නොකරන ලද මූල්‍ය වත්කම් වලින් පැවත එන දෑ ණය හා ලැබිය යුතු දෑ වේ. වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදය ඉක්මවා මාස 12 ට වැඩි කාලයකින් කල් ඉකුත් වන දෑ හැර අනිකුත් ණය හා ලැබිය යුතු දෑ ජංගම වත්කම් වල ඇතුලත්ව ඇත. වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදය අවසානයේ අධිකාරියෙහි පැවති වෙළඳ හා අනිකුත් ලැබිය යුතු දෑ, රාජ්‍ය සුරැකුම් පත් නැවත මිලදී ගැනීම්, තැන්පත්, සේවක ණය හා මුදල් සහ මුදල් සමානදෑ වලින් ණය හා ලැබිය යුතු දෑසමන්විතවේ.

**ii. විකුණාගත හැකි දෑ (AFS)**

මෙකී වර්ගයට නියම කරන ලද හෝ වෙනත් කිසිදු වර්ගයකට වර්ගීකරණය නොකරන ලද නමුත් පැවත එන මූල්‍ය වත්කම් විකිණිය හැකි ආයෝජන යටතට ගැනේ. වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදයෙන් පසු මාස 12 ක් තුල විකිණීමට තීරණය නොකරන ලද හෝ කල් පිරෙනු ලබන ජංගම වත්කම් ගණයට නොවැටෙන දේ මෙයට ඇතුලත්වේ.විකිණිය හැකි මූල්‍ය වත්කම් දිගුකාලීන ලැයිස්තගත නොවූ ස්කන්ධ ආයෝජනවලින් සමන්විතවේ.

**iii. කල්පිරීම දක්වා රඳවා ගන්නා වූ ආයෝජන (HTM)**

තීරණය කරනු ලබන හෝ ස්ථිර ගෙවීමක් ලබන සහ ස්ථිරව කල් පිරෙනු ලබන ණයහා ලැබිය යුතු දෑ කල්පිරීම දක්වා රඳවා ගන්නා වූ ආයෝජනලෙස තීරණය කරනු ලැබේ.අධිකාරිය විසින් දැනට කල් පිරෙන තෙක් රඳවාගනු ලබන, යහපත් දැක්මක් ඇති නම් එම ආයෝජනයන් කල්පිරීම තෙක් රඳවා ගන්නා ආයෝජන ලෙස වර්ගීකරනය කරනු ලැබේ.
මෙම ආයෝජනයන් වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදය අවසන් වීමෙන් පසු මාස 12ක කාලයක් නොඉක්මවන කාලයක් තුල කල් පිරෙනු ලබන ඒවා ජංගම නොවන වත්කම් යටතේ වර්ගීකරණය කෙරේ. අධිකාරිය දැනට භාණ්ඩාගාර බිල්පත් වල කර ඇති ආයෝජන මේ යටතට ගැනේ.

### 1.4.2 හඳුනා ගැනීම් සහ මුලික ගණනය කිරීම්

ණය හා ලැබිය යුතුදෑ පිළිබඳ ගණුදෙණුවක් ආරම්භවන දිනයේදී අධිකාරිය විසින් එය මුල්‍ය වත්කම් ලෙස හඳුනාගැනේ. අධිකාරිය මුල්‍ය උපයෝජනය සඳහා ගිවිසුම් වලට එලඹී එහි එක් පාර්ශවකරුවෙකු වන දිනයේදී අනිකුත් මුල්‍යවත්කම් හඳුනාගැනේ.

මුල්‍ය වත්කමක් එහි සාධාරණ අගයට පෙන්නුම් නොකෙරේ නම්, ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගය කෙලින්ම හුවමාරු කිරීමේ පිරිවැය ස්වභාවයද සැලකිල්ලට ගෙනමුල්‍ය වත්කම් මුලිකව ගණනය කරනු ලැබේ.

මුල්‍ය වත්කම් කල් පිරීම හෝ හුවමාරු කිරීම සිදුවන අවස්ථාවේදී මුදල් ප්‍රවාහයන් ලැබීම හෝ හිමිකම් ඇතිවන අවස්ථාවේදී නැවත හඳුනා ගැනෙන අතර පසුවඅධිකාරිය මුල්‍ය වත්කම්වල අයිතිය මතසියළුඅවධානම් සහ යහපත් ප්‍රථිඵලයන් මාරු කරනු ලැබේ.

### 1.4.3 දෙවනුව ගණනය කිරීම්

i. **ණය සහ ලැබිය යුතු දෑ**

මුලික හඳුනාගැනීමෙන් පසුව ණය හා ලැබිය යුතු දෑ බල පැවැත්වෙන පොලී අනුපාතයන් මත ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමය භාවිතාකර හාණි හා පාඩු සඳහා වෙන් කිරීම් අඩුකර දෙවනුව ගණනය කෙරේ.

ii. **විකුණාගත හැකි දෑ (AFS)**

මුලික හඳුනාගැනීමෙන් පසුව ලැයිස්තු ගත නොවු ආයෝජන විකුණාගතහැකි මුල්‍ය වත්කම් ලෙස වර්ග කෙරෙන අතර එහි වර්තමාන වටිනාකම නියත වශයෙන් ඇස්තමේන්තු කල නොහැකි විට පිරිවැයෙන් වෙළඳ පල අගය නිසා ඇතිවන අලාභය අඩු කිරීමෙන්ද පසු ගණනය කරනු ලැබේ.

**iv.** **කල්පිරීම දක්වා රඳවා ගන්නා වු ආයෝජන (HTM)**

කල් පිරෙන තෙක් රදවා ගන්නා ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය, බල පැවැත්වෙන පොලී අනුපාතයන් භාවිතා කරමින් වු ගණනය කිරීම් හාණි සහ පාඩු අඩු කිරීමෙන් පසුව ගණනය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේදී හා හුවමාරු පිරිවැය මත වට්ටම් සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂය ගණනය කරනු ලැබේ.

### 1.4.4 මූල්‍ය වත්කම් මත හාණි හා පාඩු

#### I. වත්කම් ක්‍රමක්ෂය පිරිවැය මත දැක්වීම

මූල්‍ය වත්කම් වල වටිනාකම හාණි වී තිබෙන බවට පිළිගත හැකි සාක්ෂි තිබේනම් වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම අධිකාරිය විසින් තක්සේරු කරනු ලැබේ. මූල්‍ය වත්කමක අගය අඩුවී තිබේනම් එම හාණි වීමෙන් සිදුවූ අඩුවීම අඩංගුව ඇති බවට පිළිගත හැකි සාක්ෂි තිබේ නම්ද, වත්කමක් හඳුනාගැනීමෙන් පසු සිද්ධීන් එකක් හෝ කිහිපයක ප්‍රතිඵලයක් ලෙස එය ඇතිවී ඇත්නම් සහ එකී පාඩු අවස්ථාව හෝ අවස්ථාවන් අනාගත ඇස්තමේන්තු ගත මුදල් ප්‍රමාණයන්ට බලපෑමක් සිදු කෙරෙන විට එය පිළිගත හැකි ලෙස ඇස්තමේන්තු කෙරේ.

ණය හා ලැබිය යුතු දෑ කල් පිරෙන තෙක් රඳවා ගන්නා ආයෝජනයන් ඒවායේ හිලව් වන පිරිවැයට ගනු ලබන අතර වත්කම දරනු ලබන වටිනාකම සහ ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන වටිනාකම ( ඇතුලත් නොවූ අනාගත බැර පාඩු හැර) අනුව අලාභය ගණනය කර එම මූල්‍ය වත්කම බල පවත්වන සත්‍ය පොලී අනුපාතය මත වට්ටම් කරනු ලැබේ.මූල්‍ය වත්කම්වල දරනු ලබන අගයෙන් හඳුනාගනු ලබන පාඩු අඩුකර එය විස්තීරණ ආදායම් ප්‍රකාශයන්ට ගණු ලැබේ.

පසු කාල පරිච්ඡේදයේදී හාණි පාඩු වටිනාකම අඩු වන්නේ නම් හාණි පාඩු සිදුවීමෙන් පසු අඩුවීම කෙලින්ම බලපානු ලබන්නේ නම්ද, එය හඳුනාගෙන විස්තීර්ණ ආදායම් ප්‍රකාශයන් මගින් පෙර හඳුනාගත් හාණි පාඩු වටිනාකම යථා තත්ත්වයට ගෙන එනු ලැබේ.

#### II විකුණාගත හැකි දෑ (AFS)

මූල්‍ය වත්කමට හාණි පාඩු සිදුවී ඇති බවට පිළිගත හැකි සාක්ෂි තිබේනම් වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම අධිකාරිය එය තක්සේරු කරනු ලැබේ. ලැයිස්තුගත නොකල ආයෝජනයන් සඳහා, ආයෝජනයන්ගේ වටිනාකම සැලකිය යුතු හෝ දිගින් දිගටම පිරිහීම පිළිබඳ සාක්ෂි ඇත්නම් වත්කමේ අගය අඩු කරනු ලැබේ. මිල නියම නොකල ආයෝජනයන් සඳහා එවැනි සාක්ෂි තිබේනම්, මූල්‍ය වත්කම දරනු ලබන වටිනාකම සහ වෙනත් එවැනි වත්කමක් සඳහා වර්තමාන ඉපයීම් වෙළඳපල අනුපාතය මගින් අනාගත ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහයන් වට්ටම්කිරීමෙන් ලැබෙන වර්තමාන අගය අතර වෙනසගණනය කර හාණි පාඩු සිදුවූ වටිනාකම ගණනය කරනු ලැබේ.එවැනි හාණි පාඩු යථා තත්ත්වයට පත් කරනු නොලැබේ.

### 1.5 භාණ්ඩ තොග

පලමු ලැබීම් පලමු නිකුත් කිරීම් (FIFO)පදනම මත පිරිවැය තීරණය කර ශුද්ධ උපලබ්ධි අගය හෝ ගත්මිල යන දෙකෙන් අඩු අගය මත තොගයන් දක්වා ඇත. පාරිභෝගික භාණ්ඩ සහ ලිපිද්‍රව්‍ය වලින් තොග සමන්විතවේ.

## 1.6 ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ මුලින්ම එහි සත්‍ය වටිනාකම් මත (ඉන්වොයිස් අගය) හදුනා ගැනීමද, ඉන් පසුව මුල් ඉන්වොයිස් වටිනාකම කෙටි කාලයක් තුල ආපසු ලැබේයයි බලාපොරොත්තුවෙන් වෙළද පල වටිනාකම සලකා එයින් හාණි සදහා අඩු කිරීමද සිදු කරන අතර, මුදල් වල කාලීන වටිනාකම සැලකිල්ලට නොගැනේ.

වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම ආපසු ලැබිය යුතු දෑ වල  වෙළද පල වටිනාකම වෙනස්වීම් වලට අදාල සාක්ෂි තිබේදැයි අධිකාරිය විසින් තීක්ෂණව තක්සේරු කරනු ලැබේ. අධිකාරියෙහි පසු ගිය අත්දැකීම් අනුව මුදල් එකතු කිරීමේ සහ ලැබීම් ප්‍රමාද සංඛ්‍යාව, ලැබීම්වල අගය අඩුවීමක් තිබේනම්  එම හාණි පාඩු ඇතුලත් වන බවට පිළිගත හැකි සාක්ෂි  තිබේනම් ලැබිය යුතු දෑ හාණි පාඩු සඳහා වෙන වෙනම තක්සේරු කරනු ලැබේ.

## 1.7 මුදල් හා මුදල් සමානදෑ

මුදල් හා මුදල් සමානදෑ තුල අතැති මුදල්, බැංකු ඒක්ෂණ තැන්පතු, මාස තුනක් හෝ ඊට පෙර කල් පිරෙනු ලබන ආයෝජන සමග අනිකුත් ඉතා ඉහල ද්‍රවශීලතාවයකින් යුත් ආයෝජන මූලීක කල්පිරීමේ වටිනාකම් මත මුදල් ප්‍රවාහ තුල ඇතුලත් කර ඇත.

## 1.8 දායකත්ව ප්‍රාග්ධනය

ශ්‍රී ලංකා මැණික් සංස්ථාව විසින් අධිකාරිය ආරම්භයේදී පවරා දෙනු ලැබූ අගයයන් මගින් ආරම්භක ප්‍රාග්ධනය නියෝජනය වේ.

## 1.9 මූල්‍ය බැරකම්

අධිකාරියෙහි මූල්‍ය බැරකම් අනිකුත් මූල්‍ය බැරකම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. අධිකාරියෙහි අනිකුත් මූල්‍ය බැරකම් වලට ගෙවිය යුතු දෑ, බලපත්‍ර සඳහා ලැබූ අත්තිකාරම්, මැණික් ගැරීමේ තැන්පතු හා අනිකුත් තැන්පත් ලැබීම් ඇතුලත්වේ. මූල්‍ය වත්කම් මුහුණත වටිනාකමට කෙලින්ම හුවමාරු පිරිවැයක් වෙත්නම් එයද ඇතුලත්ව මුලින්ම හදුනා ගැනේ. මූලික හදුනාගැනීමෙන් පසුව කෙටි කාලයක් තුලදී ආපසු ගෙවීමට බලාපොරොත්තුවන හිග මුදල්වල මූලික වටිනාකම අනුව ගණනය කර හදුනා ගැනීම සිදුකෙරේ.

කල් පිරීම, අවලංගු කිරීම, ගිවිසුම් ගත බැදීම් වලින් නිදහස් වීම වැනි අවස්ථා වලදී අධිකාරිය නැවත මූල්‍ය බැරකම් හදුනා ගැනේ.

## 1.10 ප්‍රවර්තන හා විලම්භිත බදු

කාල පරිච්ඡේදය තුල දරන ලද බදු වියදම් වල වර්තමාන හා විලම්භිත බදු අඩංගුවේ. අනිකුත් විස්තීරණ ආදායම් අයිතමයන් ප්‍රමාණයන් හැර විස්තීරණ ආදායම් ප්‍රකාශයන් මගින් ආදායම් බදු හඳුනා ගැනේ. මෙම කරුණෙහිදී පවා විස්තීරණ ආදායම් ගිණුම මගින් බදු හඳුනාගැනේ. වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදය අවසානයේදී පවත්නා බදු නීතියට අනුව අධිකාරියෙහි ක්‍රියාකාරීත්වය මගින් උත්පාදනය වන බදු අයවන ආදයම් පදනම මත වර්තමාන බදු ගණනය සිදු කෙරේ. කළමණාකාරීත්වය විසින් සුදුසුතම බදු පදනම යටතේ බදු අධිකාරීන් වෙත ගෙවිය යුතු යැයි බලාපොරොත්තුවන බදු සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වත්කම් හා වගකීම් ඒවායේ දරනු ලබන වටිනාකම මත පැන නගින තාවකාලික වෙනස අනුව විලම්භිත බදු වගකීම හඳුනාගැන්. බදු සඳහා ගනන් ගැනෙන ලාභ හෝ පාඩු මගින් ගිණුම් වලට බල පෑමක් සිදු නොවන ගණුදෙණු සිදුවන අවස්ථා වලදී හැර වත්කම් හා වගකීම් සම්බන්ධ ගණුදෙණු සිදුවන අවස්ථාවලදී විලම්භිත බදු ගිණුම් ගත නොකෙරේ. කාල පරිච්ඡේදය අවසන් වන දිනයට බල පවත්වන බදු අනුපාතයන් භාවිතයෙන් වත්කම් හා වගකීම් වල ඉදිරියට ගෙන යන නිරවුල් කලයුතු ශේෂය හා අපේක්ෂිත උපලබ්ධි මුදල මත පදනම්ව විලම්භිත බදු මුදල ගණනය කෙරේ.

අනාගත බදු වත්කම් හා වගකීම් වර්තන බදුවලට එරෙහිව හිලව් කිරීම සඳහා නීතිමය බලාත්මක අයිතියක් තිබේනම්, බදු අධිකාරීන් විසින් ආදායම් බදු පැනවීමේදී ඒ හා සම්බන්ධ වේනම් විලම්භිත බදු වගකීම් වර්තන බදු වගකීම් වලට එරෙහිව ලියා හැරේ.

## 1.11 සේවක ප්‍රතිලාභ

### (අ) නිශ්චිත දායකත්ව සැලසුම්

සේවය අවසන් කිරීමේදී ගෙවනු ලබන ප්‍රතිලාභ වෙනුවෙන් අධිකාරිය විසින් ස්ථිර දායකත්ව මුදලක් වෙනත් ආයතනයක තැන්පත් කිරීම නිශ්චිත දායකත්ව සැලසුමට අයත්වේ. අධිකාරිය තවදුරටත් දායකත්ව ගෙවීම සඳහා නීතිමය හෝ වෙනත් සම්බන්ධිත බැඳීම් කිසිවක් නොමැත. සේවක ප්‍රතිලාභ වියදම් ගෙවිය යුතු අවස්ථාවේදී එම දායකයන් හඳුනාගැනේ.

සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවකයන්ගේ දළ සේවා පාරිශ්‍රමිකයන් මත 15% දායක මුදලක්ද, සේවා නියුක්තියන්ගේ භාර අර මුදල සඳහා දළ සේවා පාරිශ්‍රමිකයන් මත 3% ක දායක මුදලක්ද අධිකාරිය විසින් දරනු ලැබේ.

(ආ) **නිශ්චිත ප්‍රතිලාභ සැලසුම**

වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසානයේදී නිශ්චිත ප්‍රතිලාභ වල එදිනට පවතින වටිනාකම මත අධිකාරියෙහි නිශ්චිත ප්‍රතිලාභ බැදීම් සම්බන්ධව ඇති බැදීයාව ගණනය කෙරේ. යෝජිත ඒකක වගකීම් ක්‍රමය අනුගමනය කරමින් ගණනය කිරීම් පාරිතෝෂික සූත්‍රය භාවිතා කරමින් සිදුකර නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැදියාව ගණනය කරනු ලැබේ. සේවකයන්ගේ වර්තමාන හා පසුගිය සේවා කාලය සහ උපයාගත් වැටුප අනාගත ඇස්තමේන්තු ප්‍රතිලාභ වල වර්තමාන වටිනාකම ගණනය මත නිශ්චිත ප්‍රතිලාභ බැදිම් තීරණය කරනු ලැබේ.

ගණනය කිරීම් වල වෙනස්වීම් මත පැන නගිනු ලබන ලාභය හෝ පාඩුව ඒවා පැන නගිනු ලබන කාල පරිච්ඡේදය, වර්තමාන සේවා පිරිවැය හා පොලිය විස්තීරණ ආදායම් ප්‍රකාශ වලට ඇතුලත්වේ.
විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් සඳහා පිටතින් මුදල් සපයා ගණු නොලැබේ.

**(ඇ) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ**

සේවකයා විසින් සපයන ලද සේවය පදනම් කරගෙන ගෙවීමට සිදුවෙතැයි අපේක්ෂා කරනු ලබන වට්ටම් නොකරන ලද මුදල මත කෙටිකාලීන සේවක ප්‍රතිලාභ බැදීම ගණනය කරනු ලැබේ.

## 1.12 ප්‍රතිපාදන සහ අසම්භාව්‍ය වගකීම්

නිශ්චිත වශයෙන් ගණනය කල හැකි හා ආර්ථික සම්පත් ඉවතට ගලායාමේ සම්භාවිතාවක් ඇති බව පසුගිය සිද්ධියක ප්‍රථිඵලයක් ලෙස නීතිමය අයුරින් හෝ වටහා ගතහැකි පරිදී වර්තමාන බැදීම් අධිකාරියට ඇතිවිට නීතිමය ඉල්ලීම් මත ප්‍රතිපාදන හා අනිකුත් ක්‍රියාකාරි වියදම් හදුනාගැනේ.

වාර්තාකරනු ලබන දිනය වන විට පිළිගත හැකි සාක්ෂි තිබේනම් හා වර්තමාන බැදීම් සමග අවධානම සහ අවිනිශ්චිතාව සම්බන්ධ වී ඇතුලත්ව තිබේ නම්, වර්තමාන බැදීම් පියවීම සඳහා අවශ්‍යවන ඇස්තමේන්තුගත වියදම් අනුව ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ.

සම්පත් ඉවතට යාමේ සම්භාවිතාවයක් නොමැති නම් සියළු අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් මගින් හෙළිදරව් කර ඇත.

## 1.13 අදායම් හදුනා ගැනීම

ලැබිය යුතු හා ලැබූ මුදල්වල සාධාරණ අගය සැලකිල්ලට ගෙන ආදායම් ගණනය කරන අතර මැණික් ගැරීමේ අයිතිය අලෙවි කිරීම, බලපත්‍ර ගාස්තු, නිර්යාත කොමිස් හා සේවා සැපයීම් වෙනුවෙන් ලැබිය යුතු මුදල්, එකතු කල අගය මත බදු (VAT) හා ජාතිය ගොඩනැගීමේ බදු (NBT) අඩු කිරීමෙන්පසු දක්වා ඇත. ආදායම් නිශ්චිත ලෙස ගණනය කල හැකි විටදී සහ අධිකාරිය වෙත අනාගතයේදී ආර්ථික පහසුකම් ලගා වේනම් ආදායම් හදුනා ගැනේ.

අධිකාරිය විසින් ප්‍රධාන වර්ගයේ සේවා සැපයීම් වෙනුවෙන් වූ ආදායම් හඳුනාගැනීම පහත සඳහන් පරිදී යොදා ගැනේ.

**(අ) මැණික් ගැරීමේ අයිතිය අලෙවිය (ඉඩම් වෙන්දේසි)**

මැණික් ගැරීමේ අයිතිය අලෙවි කිරීමේදී මැණික් ගැරීම සඳහා ඉඩම් කැබලි වෙන්කර බලපත්‍ර ලබාදීම,මිල ගණන් කැඳවීමේ ක්‍රමය අනුගමනය කර සිදුකෙරේ. මැණික් ගැරීමේ බලපත්‍ර නිකුත් කරන අවස්ථාවේදී අදායම් හඳුනාගැනේ.

**(ආ) බල පත්‍ර ගාස්තු - මැණික් කැපීමේ සහ මැණික් අලෙවි බලපත්‍ර**

බල පත්‍රයේ කාල සීමාව අනුව ඍජු ක්‍රමය යටතේ බලපත්‍ර ගාස්තු ආදායම් හඳුනාගැනේ.

**(ඇ) බල පත්‍ර ගාස්තු - මැණික් ගැරීමේ, යන්ත්‍ර මගින් මැණික් ගැරීමේ (BACO)සහ මැණික් වෙන්දේසි බලපත්‍ර**

මැණික් ගැරීමේ බලපත්‍ර නිකුත් කරන අවස්ථාවේදි බලපත්‍ර ගාස්තු ආදායම් හඳුනාගැනේ.

**(ඈ) මැණික් හා ස්වර්ණාභරණ නිර්යාත කොමිස් - ( නිර්යාත සේවා ගාස්තු සහ කටුනායක දියමන්ති මධ්‍යස්ථානයේ සේවා ගාස්තු)**

භාණ්ඩ නිර්යාත කිරීමට සූදානම් කල අවස්ථාවේදී නිර්යාත කොමිස් ආදායම් ලෙස හඳුනාගැනේ.

**(ඉ) සේවා**

මැණික් ඉඩම් පරීක්ෂා කිරීම වෙනුවෙන් වූ ආදායම් ගෙවීම් ලැබෙන අවස්ථාවේදී ආදායම් ලෙස හඳුනා ගැනේ.

**(ඊ) කුලී ආදායම්**

බඳු කොන්දේසි සැලකිල්ලට ගෙන උපචිත පදනම මත කුලී ආදායම හඳුනා ගැනේ.

**(උ) පොළී ආදායම්**

ක්‍රියාත්මක වන පොලී ක්‍රමය මත පොළී ආදායම් හඳුනාගැනේ.

**(ඌ) ලාභාංශ ආදායම්**

ගෙවීම් කිරීම තහවුරු කරනු ලබන අවස්ථාවේදී ලාභාංශ ආදායම් හඳුනාගැනේ.

**(එ) දේපළ, පිරියත හා උපකරන ඉවත් කිරීමේදී ඇතිවන ලාභ හෝ පාඩු**

ඉවත් කිරීමේදී ඇතිවන ලාභ හෝ පාඩු තීරණය කිරීම එම වත්කමෙහි දරනු ලබන අගය සහ විකුණා ලැබෙන මුදල සමග සැසඳීමෙන් පසුව විස්තීරණ ආදායම් ප්‍රකාශයන් හීදී සිදුකෙරේ.

## 1.14 වියදම්

වාර්තා කරනු ලබන කාලපරිච්ජේයට අදාලව ලාභ ඉපයීම සඳහා ආයතනයේ මෙහෙයුම් පවත්වාගෙන යාමට දරනු ලබන සියළු වියදම් ඇතුලත්වේ.

**1.15 වාර්තා කරනු ලබන කාලයට පසු සිදුවීම්**

වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදයට පසු සිදුවීම් වල ප්‍රමාණාත්මක බව සලකා අවශ්‍ය පරිදී ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශන වල සටහන් මගින් හෙළිදරව් කර ඇත.

**1.16 බැදීම්**

වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදය අවසානයේ පවතින සියළු ප්‍රමාණාත්මක බැදීම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වල සටහන් මගින් හෙළිදරව් කර ඇත.

**1.17 වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීරණයන්**

මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී කළමණාකාරිත්වය විසින් වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හදුනා ගැනීමට සහ ඒවා ගණනය කිරීම සඳහා බොහෝ තීරණයන් මත ඇස්තමේන්තු සහ උපකල්පනයන් සිදුකර ඇත.

i. මූල්‍ය ප්‍රකාශනවලට බොහෝ බලපෑම් ඇති කරනු ලබන ගිණුම් ප්‍රමිත භාවිතා කිරීමේදී පහත සඳහන් වැදගත් තීරණයන් ගනු ලැබීය.

(අ) **විලම්භිත බදු වත්කම් හදුනාගැනීම**

වත්කම්වල අනාගත ප්‍රයෝජනයට ගතහැකි අගයට එරෙහිව අනාගතයේ බදු ආදායමක් ලැබීමේ සම්බන්ධතාවයක් පවතීනම් එම වත්කම් එම ප්‍රමාණයට පමණක් විලම්භිත බදු වත්කම හදුනාගැනේ.

ii. වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හදුනාගැනීම සහ ගණනය කිරීම් වලදී බොහෝ වැදගත් සිදුවීම් සඳහා ඇස්තමේන්තු සහ උපකල්පනයන් පිළිබද තොරතුරු පහත දක්වා ඇත.

(අ) **ක්ෂය වන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය**

වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම ක්ෂය වන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය ඇස්තමේන්තු කිරීමේදී එම වත්කමෙහි යෝජිත ආර්ථික භාවිතය පදනම්ව කළමනාකාරිත්වය සලකා බලනු ලැබේ. මෙම ඇස්තමේන්තු වලදි තාක්ෂණිකව අභාවයට යෑම පිළිබද පරිගණක උපාංග හා පරිගණක මෘදුකාංග වල අවිනිශ්චිතතාවයක් පවතී.

(ආ) **නිශ්චිත ප්‍රතිලාභ සැලසුම**

උපකල්පනයන් ගණනාවක් භාවිතා කරමින් හා සාධක ගණනාවක් සැලකිල්ලට ගනිමින් යෝජිත ඒකක බැර පදනම මත නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැදීම් වල වර්තමාන වටිනාකම තීරණය කෙරේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැදීම සහ ශුද්ධ පිරිවැය උපකල්පනය කිරීමේදී යොදාගන්නා වට්ටම් අනුපාතයන් සටහන් 22.1 මගින් හෙළිදරව් කර ඇත. නිශ්චිත ප්‍රතිලාභ බැදීම් වල වර්තන වටිනාකමට මෙම උපකල්පනයන්ගේ වෙනස්වීම් බලපානු ලැබේ.

**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය**

**2014දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය** **ශ්‍රී ලංකා රුපියල් වලින්**

| | දායක ප්‍රාග්ධනය | මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල | ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල | මැණික් ත්‍යාග අරමුදල | අනිකුත් සංචිත | මැණික් ප්‍රත්‍යාගණන සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | රඳවාගත් ඉපයුම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2013ජනවාරි 01 දිනට ශේෂය | **30,000,000** | **27,227,498** | **23,657,481** | **33,302 891** | **-** | **355,074.648** | **52,945,425** | **383,673,444** | **905,881,387** |
| සාධාරණ අගයට ගැලපීම් | | | | | | | | | |
| වර්ෂය සඳහා ලාභය | | | | | | | | 59,162,844 | 59,162.844 |
| අනිකුත් විස්තිරණ ආදායම් | | | | | | | | | |
| විස්තිරණ ආදායම් එකතුව | | | | | | | | | **965,044,231** |
| පසුගිය වර්ෂයට ගැලපීම් | | | | | | | | (2,608,868) | (2,608,868) |
| වර්ෂය සඳහා දායකත්වය/ (උපයෝජනය) | | (300,000) | 5,401,782 | 3,208,559 | | | | | 8,310,341 |
| අගය අඩුවීමට ගැලපීම් | | | | | | | | | |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | **30,000,000** | **26,927,498** | **29,059,263** | **36,511,450** | **-** | **355,074,648** | **52,945,425** | **440,155,420** | **970,673,704** |
| සාධාරණ අගයට ගැලපීම් | | | | | | | | | |
| වර්ෂය සඳහා ලාභය | | | | | | | | 169,594,693 | 169,594,693 |
| අනිකුත් විස්තිරණ ආදායම් | | | | | | | | | |
| විස්තිරණ ආදායම් එකතුව | | | | | | | | | **169,594,693** |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් | | | | | | | | 5,829,587 | 5,829,587 |
| වර්ෂය තුල දායකත්වය/ (උපයෝජනය) | | 438,430 | 8,445,500 | (477,540) | | | | | 8,406,390 |
| හානි පාඩු සඳහා ගැලපීම් | | | | | | | | | |
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | **30,000,000** | **27,365,928** | **37,504,763** | **36,033,910** | **-** | **355,074,648** | **52,945,425** | **615,579,700** | **1,154,504,373** |

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

## 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

| | 2014 | 2013 |
|---|---|---|
| **බදු වලට පෙර ලාභය** | **314,942,235** | **120,084,001** |
| **ගැලපීම්** | | |
| ක්ෂයවීම් | 27,371,312 | 25,259,064 |
| අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක් ක්ෂය | 208,875 | 208,875 |
| විශ්‍රාම පාරිතෝෂික බැදීම් | 8,259,512 | 8,115,151 |
| ලාභාංශ | (540,000) | (1,351,171) |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීමෙන් වූ ලාභ | - | (103,034) |
| පොලී ආදායම් | (61,245,077) | (110,141,997) |
| කල්බදු ගෙවීම් බැදීම් වලදී ඇතිවූ මුල්‍ය පිරිවැය | 24,765 | 24,500 |
| භාවිතයට අයිති ඉඩම් වල ක්‍රමක්ෂය | 2,364 | 2,364 |
| තැන්පත් සහ අත්තිකාරම් වල හාණි පාඩු සඳහා වෙන් කිරීම් | - | - |
| බොල්ණය | - | 1,404,560 |
| නිත්‍යාණුකූල ඉල්ලීම් සඳහා වූ ප්‍රතිපාදන | | 3,400,000 |
| යන්ත්‍ර, පිරියත හා උපකරණ වල අගය අඩුවීම සඳහා වූ ප්‍රතිපාදන | - | 1,952,934 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය** | **289,023,987** | **48,855,247** |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම්** | | |
| තොග | (1,981,404) | (460,804) |
| ලැබිය යුත දෑ | (19,509,014) | 2,914,651 |
| තැන්පතු සහ අත්තිකාරම් | (11,435,352) | (1,018,568) |
| ඉදිරි ගෙවීම් | - | 499,457 |
| සේවක ණය සහ අත්තිකාරම් | (448,254) | 90,128 |
| ගෙවිය යුතු දෑ | 25,438,445 | 26,543,054 |
| මැණික් ගැරීමේ තැන්පතු | 43,238,645 | 100,625,475 |
| තැන්පතු සහ අත්තිකාරම් ලැබීම් | 9,846,592 | 24,168,449 |
| වෙන් කිරීම් සහ උපචිත වියදම් | 29,188,337 | (1,799,657) |
| **මෙහෙයුම් වලින් ජනිත මුදල්** | **363,361,983** | **200,417,432** |
| පාරිතෝෂික ගෙවීම් | (1,180,212) | (2,726,309) |
| ගෙවූ බදු | (61,318,311) | (135,980,365) |
| **මෙහෙයුම් වලින් ජනිත ශුද්ධ මුදල්** | **300,863,461** | **61,710,758** |

| | | |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| යන්ත්‍ර පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම | (44,428,902) | (12,141,003) |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීමේදි ලැබීම් | - | 130,700 |
| ලාභාංශ ලැබීම් | 540,000 | 901,934 |
| අනිකුත් මූල්‍ය වත්කම් වල ශුද්ධ ආයෝජනයන් | (114,756,127) | (94,670,183) |
| භාණ්ඩාගාර බිල්පත් වල ශුද්ධ ආයෝජන | (266,259,974) | (24,771,625) |
| පොලී ලැබීම් | 61,245,077 | 110,141,997 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද (භාවිතා කරන ලද) ශුද්ධ මුදල්** | **(363,659,927)** | **(20,408,180)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහ** | | |
| මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල් උපයෝජනය | 438,430 | (300,000) |
| කල්බදු සඳහා වූ වගකීම් සමථය | (26,235) | (26,235) |
| ස්වර්ණාභරණ සංවර්ධන අරමුදලට දායකය | 8,445,500 | 5,401,785 |
| මැණික් ත්‍යාග අරමුදලට දායකය | (477,540) | (3,208,560) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **8,380,065** | **8,284,020** |
| මුදල් සහ මුදල් සමානයන් ශුද්ධ වෙනස්වීම | **(54,416,401)** | **49,586,598** |
| වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමානයන් | **97,964,396** | **48,377,798** |
| වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමානයන්(සටහන5) | **43,547,995** | **97,964,396** |

| 3 | දේපල, පිරියත හා උපකරණ පිරිවැයට | 2014 ජනවාරි 01 දිනට | එකතු කිරීම් | ඉවත් කිරීම් | 2014 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|
| | **බැදීම් වලින් නිදහස්** | | | | |
| | ඉඩම් | 37,941,670 | - | | 37,941,670 |
| | ගොඩනැගිලි | 153,400,267 | 6,776,699 | | 160,176,966 |
| | සවිකිරිම් සහ උපකරණ | 13,365,381 | 790,929 | | 14,156,310 |
| | ලීබඩු | 11,258,820 | 1,181,975 | | 12,440,795 |
| | කාර්යාල උපකරණ | 14,567,396 | 3,371,228 | | 17,938,624 |
| | පරිගණක | 19,344,213 | 5,163,285 | | 24,507,498 |
| | පර්යේෂණාගාර උපකරණ | 20,586,399 | 3,114,598 | | 23,700,997 |
| | මැණික් කැපිමේ උපකරණ | 403,475 | | | 403,475 |
| | ස්වර්ණාභරණ උපකරණ | 148,200 | | | 148,200 |
| | තත්ත්ව මුද්‍රා උපකරණ | 25,301,671 | 4,316,362 | | 29,618,033 |
| | යන්ත්‍ර සහ ගෙවුඩ උපකරණ | 8,292,358 | | | 8,292,358 |
| | රථ වාහන | 83,244,588 | 19,687,500 | | 102,932,088 |
| | යතුරු පැදි | 100,000 | | | 100,000 |
| | පාපැදි | 37,334 | | | 37,344 |
| | මැණික් කැපීමේ පොත් | 6,900 | | (1,200) | 5700 |
| | **කල් බදු** | | | | |
| | ඉඩම් | 159,205 | 26,325 | (26,325 | 159,205 |
| | | **388,157,877** | **44,428,902** | **(27,525)** | **432,559,254** |

| ක්ෂයවීම් | 2014 ජනවාරි 01 දිනට | වර්ෂය සඳහා | ගැලපීම් | 2014 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|
| ගොඩනැගිලි | 36,315,405 | 4,095,568 | | 40,410,973 |
| සවිකිරීම් සහ උපකරණ | 11,132,337 | 490,092 | | 11,622,429 |
| ලීබඩු | 8,072,239 | 734,367 | | 8,806,606 |
| කාර්යාල උපකරණ | 7,798,630 | 1,353,120 | | 9,151,750 |
| පරිගණක | 12,933,338 | 2,439,496 | | 15,372,834 |
| පර්යේෂණාගාර උපකරණ | 9,955,711 | 1,999,369 | | 11,955,080 |
| මැණික් කැපිමේ උපකරණ | 279,715 | 32,.200 | | 311,915 |
| ස්වර්ණාභරණ උපකරණ | 148,200 | - | | 148,200 |

| | | | | |
|---|---|---|---|---|
| තත්ත්ව මුද්‍රා උපකරණ | 16,196, 428 | 1,618,990 | | 17,815,418 |
| යන්ත්‍ර සහ ගෙවුඩ උපකරණ | 8,275,866 | 16,492 | | 8,292,358 |
| රථ වාහන | 44,286,542 | 14,590,681 | 7,958,059 | 66,835,282 |
| යතුරු පැදි | 100,000 | - | | 100,000 |
| පාපැදි | 34,515 | 936 | | 35,451 |
| පුස්තකාල පොත් | | | | |
| | **155,528,926** | **27,371,312** | **7,958,059** | **190,858,297** |

| ශුද්ධ ධාරන අගය | **2014 දෙසැම්බර් 31** දිනට | **2013 දෙසැම්බර් 31** දිනට |
|---|---|---|
| **බැදීම් නොමැති** | | |
| ඉඩම් | 37,941,670 | 37,941,670 |
| ගොඩනැගිලි | 119,765,993 | 120,788,404 |
| සවිකිරීම් සහ උපකරණ | 2,533,882 | 2,292,477 |
| ලීබඩු | 3,634,190 | 3,628,467 |
| කාර්යාල උපකරණ | 8,786,874 | 7,036,986 |
| පරිගණක | 9,134,664 | 6,456,407 |
| පර්යේෂණාගාර උපකරණ | 11,745,917 | 9,984,726 |
| මැණික් කැපිමේ උපකරණ | 91,560 | 155,960 |
| ස්වර්ණාභරණ උපකරණ | - | (17,955) |
| තත්ත්ව මුද්‍රා උපකරණ | 11,802,615 | 5,522,956 |
| යන්ත්‍ර සහ ගෙවුඩ උපකරණ | - | 122,347 |
| රථ වාහන | 36,096,806 | 54,642,881 |
| යතුරු පැදි | - | 25,000 |
| පාපැදි | 1,883 | 3,755 |
| පුස්තකාල පොත් | 5,700 | 6,900 |
| කල්බදු | | |
| ඉඩම් | 159,205 | 159,205 |
| | **241,700,958** | **248,750,186** |
| අගය අඩුවීමට ගැලපීම් | (4,887,690) | (2,934,756) |
| | **236,813,268** | **245,815,430** |

මාරග සංවර්ධන අධිකාරියේ හෙළි දරවි කිරීම් අනුව නැවත ඇහැළිය ඉදිකරන ලද ගොඩනැගිල්ල නැවත විකුණා මුදලක් අයකර ගත නොහැකි බැවින් සාධාරණ අගය හාණි සඳහා වු ප්‍රතිපාදන වලට මාරු කරන ලදී.

4 **කල්බදු ඉඩම් - ඉඩම් භාවිතය සඳහා අයිතිය**

කල් බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම ණයට ගැනීම් සඳහා වූ වර්ධනය වන වට්ටම් අනුපාතය මත ගණනය කිරීමෙන් පසු වටිනාකමට කල්බදු ඉඩම් ඉඩම් භාවිතය සඳහා අයිතිය ගණනය කරනු ලැබේ.

| **ඉඩම් භාවිතය සඳහා** | **2014** | **2013** |
|---|---|---|
| **දරනවටිනාකම** | | |
| **ප්‍රාග්ධනිත අගය** | | |
| ජනවාරි 01 දිනට | **70,909** | **70,909** |
| ඇතුලත් මූලික පිරිවැය | - | - |
| වර්ෂයතුල ප්‍රාග්ධනිත කිරීම් | - | - |
| දෙසැම්බර් 31 දිනට | **70,909** | **70,909** |
| **ක්‍රමක්ෂය** | | |
| ජනවාරි 01 දිනට | **40,182** | **37,818** |
| වර්ෂය තුල ක්‍රමක්ෂය වීම | 2,364 | 2,364 |
| දෙසැම්බර් 31 දිනට | **42,546** | **40,182** |
| **දරනු ලබන වටිනාකම** | **28,363** | **30,727** |

**ඉඩම්වල කල්බදු අයිතිය 1997 නොවැම්බර් මස ආරම්භ වි අවරුදු 30 දක්වා වේ. කල්බදු කොන්දේසි අනුව 2026 නොවැම්බර් දක්වා වාර්ෂිකව ඉඩම් භාවිතය සඳහා වූ කල්බදු අයිතිය සංක්‍රාන්ති අවධිය වූ (2011 ජනවාරි 01) සිට ඉදිරි කාලය තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.**

5 **අස්පෘශ්‍ය වත්කම්**

| | **2014 දෙසැම්බර් 31 දිනට** | **එකතු කිරීම්/ඉවත් කිරීම්** | **2013 දෙසැම්බර් 31 දිනට** |
|---|---|---|---|
| **5.1 පිරිවැයට** | | | |
| පරිගණක මෘදුකාංග | 2,530,056 | - | 2,530,056 |
| **එකතුව** | **2,530,056** | **-** | **2,530,056** |

| **5.2 ක්‍රමක්ෂය** | **2014 දෙසැම්බර් 31 දිනට** | **වර්ෂය සඳහා වැය** | **2013 දෙසැම්බර් 31 දිනට** |
|---|---|---|---|
| පරිගණක මෘදුකාංග | 2,381,140 | 208,875 | 2,172,265 |
| **එකතුව** | **2,381,140** | **208,875** | **2,172,265** |

| **5.3 දරණ ශුද්ධ අගය** | **2014 දෙසැම්බර් 31 දිනට** | **2013 දෙසැම්බර් 31 දිනට** |
|---|---|---|
| පරිගණක මෘදුකාංග | 148,916 | 357,791 |

| | | | | |
|---|---|---|---|---|
| 6 | **විලම්භිත බදු වත්කම්/(වගකීම්)** | | **2014** | **2013** |
| | ජනවාරි 01 දිනට ශේෂය | | (16,062,221) | 16,062,221 |
| | ගැලපීම් | | (861,151) | (2,230,123) |
| | දෙසැම්බර් 31 දිනට ට ශේෂය | | **(16,923,372)** | **(18,292,344)** |
| 7 | **අනිකුත් වත්කම්** | | **2014** | **2013** |
| | රළු ගල් සහ සින්තටික් ගල් | | 96,683 | 96,683 |
| | ප්‍රදර්ශන මැණික් ගල් | | 371,842,648 | 371,842,648 |
| | මැණක් සහ මැණික් ආයතන වලට අත්තිකාරම් ගෙවීම් | | 200,000 | 200,000 |
| | | | **372,139,331** | **372,139,331** |
| | හාණි පාඩු සඳහා වෙන්කිරිම් | | (200,000) | (200,000) |
| | | | **371,939,331** | **371,939,331** |
| 8 | **විකිණිය හැකි (AFS) මුල්‍ය වත්කම්** | | | |
| | ලැයිස්තු ගත නොකල ආයෝජන | (සටහන් 8.1) | **1,200,010** | **1,200,000** |
| | **8.1 ලැයිස්තු ගත නොකල ආයෝජන** | කොටස් සංඛ්‍යාව | | |
| | සීමා සහිත ලංකා එක්සත් පුවත්පත් සමාගම | 200,000 | 200,000 | 200,000 |
| | ජී.එස්.එම්.බී. තාක්ෂණික සේවා පුද්ගලික සමාගම | 100,000 | 1,000,010 | 1,000,000 |
| | | | **1,200,010** | **1,200,000** |
| 9 | **භාණ්ඩ තොග** | | | |
| | පාරිභෝගික භාණ්ඩ | | 1,974,996 | 1,360,639 |
| | මැණික් - ගෙවුඩ මධ්‍යස්ථානය | | 183,548 | 183,548 |
| | මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය තොග | | 1,983,265 | 616,218 |
| | | | 4,414,809 | **2,160,405** |
| 10 | **ලැබිය යුතු දෑ** | | | |
| | ලැබිය යුතු දෑ | | 29,201,426 | 9,512,985 |
| | හාණි පාඩු සඳහා වෙන්කිරිම | | (1,407,972) | (1,407,972) |
| | | | **27,973,454** | **8,105,013** |
| | අනිකුත් | | 1,111,694 | 1,291,121 |
| | | | **28,905,148** | **9,396,134** |
| 11 | **කල් පිරෙන තෙක් වූ ආයෝජන (HTM) ක්‍රමක්ෂය පිරිවැය මත දරන වටිනාකම** | | | |
| | භාණ්ඩාගාර බිල්පත් | | 482,639,856 | 216,381,558 |

| | | | |
|---|---|---|---|
| 12 | තැන්පතු සහ අත්තිකාරම් | | |
| | පොදු තැන්පත් | 36,407,684 | 32,143,890 |
| | අනිකුත් | 19,525 | 19,525 |
| | නිවාස කුලී අත්තිකාරම් | - | - |
| | ඉඩම් වෙන්දේසි 40% | - | - |
| | ආරක්ෂිත තැන්පතු | 34,500 | 54,500 |
| | සැපයුම්කරුවන්ට ගෙවූ අත්තිකාරම් | 9,117,109 | 1,925,552 |
| | | **45,578,819** | **34,143,467** |
| | හානි පාඩු සඳහා ප්‍රතිපාදන | (1,433,947) | (1,433,947) |
| | | **44,144,872** | **32,709,520** |
| 13 | **සේවක ණය සහ අත්තිකාරම්** | | |
| | අත්තිකාරම් | 48,750 | 80,496 |
| | වැටුප් රහිත නිවාඩු | 256,843 | 169,332 |
| | වාහන ණය | 219,983 | 400,171 |
| | ණය | - | - |
| | රෙදිපිළි ණය | 205,000 | 186,522 |
| | ආපදා ණය | 13,377,427 | 12,823,229 |
| | | **14,108,003** | **13,659,749** |
| 14 | **අනිකුත් මූල්‍ය වත්කම්** | | |
| | ස්ථාවර තැන්පත් | 739,722,904 | 625,854,003 |
| | රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත අරමුදල | 14,409,721 | 13,522,485 |
| | | **754,132,625** | **639,376,488** |
| 15 | **මුදල් සහ මුදල් සමාන දෑ** | | |
| | මුදල් හා බැංකු ශේෂයන් - ශ්‍රී. ලං. රු. | 30,079,962 | 55,692,429 |
| | බැංකු ශේෂය (විදේශ ව්‍යවහාර මුදල්) | 3,468,032 | 37,119 |
| | සුළු මුදල් | - | - |
| | භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන | 10,000,000 | 42,234,847 |
| | | **43,547,994** | **97,964,396** |

16. **දායක ප්‍රාග්ධනය**

ශ්‍රී ලංකා මැණික් සංස්ථාව විසින් අධිකාරිය ආරම්භයේදී පවරා දෙනු ලැබූ අගයයන් මගින් ආරම්භක ප්‍රාග්ධනය නියෝජනය වේ.

17. **මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල**

මැණික් කර්මාන්තයේ නියුතු සේවකයන්ගේ ජීවිත අවධානම නිසා ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් අධිකාරිය විසින් 1993 අංක 50 දරන මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 1 කොටසේ 14(එන්) වගන්තියට අනුකූලව 2008 වනතුරු මැණික් ගරන්නන්ගෙන් අරමුදල් එකතු කරන ලදී.

18. **ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල**

ස්වර්ණාභරණ කර්මාන්තයේ තාක්ෂණික සංවර්ධනය වෙනුවෙන් 2007 අයවැය යෝජනා අනුව ස්වර්ණාභරණ නිෂ්පාදකයින් ගෙන් වාර්ෂික ලියාපදිංචි ගාස්තුව වූ රු.5,000 බැගින් වූ මුදලින් මෙම අරමුදල සංයුක්තවේ.

19. **මැණික් ත්‍යාග අරමුදල**

1993 අංක 50 දරන මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ iv කොටසේ 52 වගන්තියේ අවශ්‍යතාවය අනුව අධිකාරිය වෙත ලැබෙන අපරාධ වෙනුවෙන් අදාල පාර්ශවයන්ගෙන් අයකරනු ලබන ගාස්තු සහ දඩ මුදල් දඩ අරමුදල වෙත බැර කිරීමෙන් මෙම අරමුදල සමන්විතවේ. අධ්‍යක්ෂ මණ්ඩල චක්‍රලේක අංක 824 උපදෙස් අනුව වැටලීම් කණ්ඩායම්වලට සහ සේවකයන්ට ත්‍යාග පිරිනැමීම සදහා මෙම අරමුදල නඩත්තු කෙරේ.

20. **මැණික් ප්‍රත්‍යාගණන සංචිත**

මැණික් ප්‍රදර්ශන වලට ඉදිරිපත් කරනු ලබන මැණික් ගල් ප්‍රත්‍යාගණනය කිරීමෙන් ඇතිවන අතිරික්ත වලින් සමන්විතවේ.

21. **ප්‍රත්‍යාගණන සංචිත**

ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීම තුලින් ඇතිවන ප්‍රත්‍යාගණන අතිරික්තයන් ගෙන් ප්‍රත්‍යාගණන සංචිතය සමන්විත වන අතර ප්‍රත්‍යාගණනය කරන ලද එකිනෙක වත්කම් ඉවත් කිරීමේදී එම වත්කමට අදාල ප්‍රත්‍යාගණන අතිරික්ත වටිනාකම රදවාගත් ඉපයුම් වලට මාරු කරනු ලැබේ.

22.

| **විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්** | **2014** | **2013** |
|---|---|---|
| **ජනවාරි 01 දිනට ශේෂය** | **23,995,857** | **18,607,015** |
| විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි වියදම්හදුනාගැනීමසටහන් 22.1 | 8,259,512 | 8,115,151 |
| 2013 වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීම් | (1,180,212) | (2,726,309) |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **31,075,157** | **23,995,857** |

| 22.1 **විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි වියදම්හදුනාගැනීම** | | |
|---|---|---|
| පොලී වියදම | 2,142,830 | 1,979,786 |
| වර්ෂය තුල අයකිරීම් | 1,495,199 | 1,107,708 |
| උපකල්පනයන්ගේ වෙනස්වීම් තුලින් පැන නගින (ලාභ)/ අලාභ | 4,621,563 | 5,027,657 |
| | **8,259,512** | **8,115,151** |

විශ්‍රාම ප්‍රතිලාභ ගණනය කිරීමේදී අධිකාරියේ කළමනාකාරීත්වය වඩාත් උචිත විචලා ඇස්තමේන්තු පදනම් කරගෙන මෙම උපකල්පනයන් සංවර්ධනය කෙරේ.

**භාවිතා කරනු ලබන මූලික උපකල්පනයන් පහත දැක්වේ**

| | | |
|---|---|---|
| වට්ටම් අනුපාත | 9 | 12.0 |
| අනාගත වැටුප් වැඩිවීම් සාමාන්‍ය වේතන (%) | 1.3 | 1.3 |
| සේවක පිරිවැටුම් සාධකය (%) | 2.4 | 7.2 |
| විශ්‍රාම යන වයස (අවුරුදු) | 60 | 60 |

දිගුකාලීන රජයේ බැදුම්කර වෙළඳ අනුපාත සඳනම මත වට්ටම් අනුපාත තීරණය කරනු ලැබේ.

| 23 | **කල්බදු ගෙවීම් සඳහා වූ වගකීම** | **2014** | **2013** |
|---|---|---|---|
| | **දළ වගකීම** | | |
| | **ජනවාරි 01 දිනට** | 573,239 | 599,594 |
| | වර්ෂය තුල හදුනා ගැනීම් | - | - |
| | වර්ෂය තුල ගෙවීම් | (26,325) | (26,325) |
| | **දෙසැම්බර් 31 දිනට** | **546,914** | **573,239** |
| | **මූල්‍ය පිරිවැය** | | |
| | ජනවාරි 01 දිනට | 559,329 | 593,829 |
| | වර්ෂය තුල හදුනා ගැනීම් | | - |
| | වර්ෂය තුල විස්තීරණ ආදායම තුල මූල්‍ය පිරිවැය හදුනා ගැනීම | (24,765) | (24,500) |
| | අනාගත කාල පරිච්ජේදය සඳහා මූල්‍ය පිරිවැය ප්‍රතිපාදනය | **534,564** | **559,329** |
| | දෙසැම්බර් 31 දිනට ශුද්ධ බැදීම් | **(12,350)** | **(13,910)** |
| | 23.1 වගකීම් වර්ගීකරණය | | |
| | වර්ෂයක් තුල පිය විය යුතු | | |
| | දළවගකීම් | 26,995 | 26,995 |
| | අනාගත කාල පරිච්ජේද සඳහා මූල්‍ය පිරිවැය ප්‍රතිපාදනය | (24,765) | (24,765) |
| | | **2,230** | **2,230** |
| | වර්ෂයඉක්මවූ | | - |
| | පියවීම වර්ෂ දෙකත් සහ පහත් අතර | | |
| | දළ වගකීම් | 144,787 | 131,625 |
| | අනාගත කාල පරිච්ජේද සඳහා මූල්‍ය පිරිවැය | (139,918) | (126,444) |
| | ප්‍රතිපාදනය | | |
| | | **4,869** | **5,181** |

| | | 2014 | 2013 |
|---|---|---|---|
| | පියවීම වර්ෂ පහ ඉක්මවූ | | |
| | දළ වගකීම් | 375,132 | 414,619 |
| | අනාගතකාල පරිච්ඡේද සඳහා මූල්‍ය පිරිවැය | (369,881) | (408,120) |
| | ප්‍රතිපාදනය | | |
| | | **5,251** | **6,499** |
| | වර්ෂයක් ඉක්මවා පියවිය යුතු වගකීම් එකතුව | **10,120** | **11,680** |
| | දෙසැම්බර් 31 දිනට ශුද්ධ වගකීම් එකතුව | **12,350** | **13,910** |

| | | | |
|---|---|---|---|
| 24 | **ගෙවියයුතු** | | |
| | ණයහිමියෝ | 98,136,434 | 62,031,660 |
| | කොන්ත්‍රාත්කරුවන්ගේ රඳවාගත් මුදල් | 2,568,873 | 2,568,873 |
| | අනිකුත් | 3,236,639 | 115,325 |
| | | **103,941,946** | **64,715,858** |

| | | | |
|---|---|---|---|
| 25 | **තැන්පතු සහ අත්තිකාරම් ලැබීම්** | | |
| | අත්තිකාරම් ලැබීම් | 16,659,550 | 1,669,387 |
| | බලපත්‍ර ගාස්තු | - | 15,243,550 |
| | සේවක ආරක්ෂිත තැන්පතු | 64,500 | 114,500 |
| | ගණුදෙණු කරුවන්ගේ අත්තිකාරම් | 15,896 | 15,896 |
| | සේවකයන්ගේ වැඩිපුර අයකර ගැනීම් | 1,500 | 3,066 |
| | ඉඩම් ආරවුල් තැන්පතු | 58,283,065 | 53,378,475 |
| | ටෙන්ඩර් තැන්පතු | 14,836,500 | 14,103,500 |
| | ලෝක වෙළඳ මධ්‍ය. වෙලද කුටි රඳවා ගැනීම් | 16,032,340 | 11,474,385 |
| | වෛද්‍ය යෝජනාක්‍රම අරමුදල | 280,000 | 280,000 |
| | නිර්යාත කොමිස් තැන්පතු | 125,997 | 125,997 |
| | අනිකුත් | - | 45,000 |
| | | **106,299,348** | **96,452,755** |

| | | | | |
|---|---|---|---|---|
| 26 | **ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ** | | | |
| | සංස්ථාපිත බදු | (සටහන් 26.1) | 116,716,514 | 60,105,954 |
| | එකතුකල අගය මත බදු | | 4,527,831 | 8,736,530 |
| | රඳවාගත් බදු | | (11,743,761) | (3,017,710) |
| | රඳවාගත් මැණික් වෙනදේසි බදු 2.5% | | 37,374,163 | 22,633,413 |
| | ජාතිය ගොඩනැගීමේ බදු | | 917,914 | 1,782,649 |
| | මුද්දර ගාස්තු | | 2,299,667 | 2,432,636 |
| | උපයන විට ගෙවීම් | | (37,464) | (35,085) |
| | | | **150,054,864** | **92,638,388** |

**26.1 සංස්ථාපිත බදු**

| | | |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | 60,105,955 | 1,414,921 |
| වර්ෂය සඳහා වර්ථන බදු | 146,716,514 | 58,691,034 |
| වර්ෂයතුල ගෙවීම් - පසුගිය වසර බැදීම් පියවීම | (46,318,312) | - |
| ස්ව තක්සේරු ගෙවීම් | (30,000,000) | - |
| බදු බැර පියවීම් - ආර්ථික සේවා ගාස්තු | - | - |
| - රඳවාගත් බදු | - | - |
| - ජාතිය ගොඩනැගීමේ බදු | - | - |
| පසුගිය වර්ෂය සඳහා වු අධි/(ඌණ) වෙන්කිරීම් මත ගැලපීම | (13,787,643) | - |
| | **116,716,514** | **60,105,954** |

27 **වෙන්කිරීම් සහ උපචිත වියදම්**

| | | |
|---|---|---|
| නිත්‍යානුකූල හිමිකම් සඳහා වෙන්කිරීම් | 195,300 | 195,300 |
| උපචිත වියදම් | 48,831,056 | 19,265,460 |
| | **49,026,356** | **19,460,760** |

28 **ආදායම්**

| | 2014 | 2013 |
|---|---|---|
| ඉඩම් වෙන්දේසි - රජයේ ඉඩම් | - | 7,672,714 |
| ඉඩම් වෙන්දේසි - ඉඩම් ප්‍ර.කොමි. | 22,553,180 | 15,114,475 |
| සේවා සහ බලපත්‍ර අභියාචන ගාස්තු | 688,517 | 763,440 |
| මැණික් ගැරීමේ බලපත්‍ර ගාස්තු | 35,767,987 | 37,148,274 |
| වෙළදාම් බලපත්‍ර ගාස්තු | 33,627,320 | 30,364,822 |
| ත්‍යාග සහ සාම්පල් සඳහා සේවා ගාස්තු | 353,115 | 222,000 |
| මැණික් හා ස්වර්ණාභරණ නිර්යාත සේවා ගාස්තු | 126,129,260 | 96,606,783 |
| මැණික් කැපීමේ බලපත්‍ර ගාස්තු | 239,320 | 207,800 |
| ගෙවුඩ නිර්යාත සේවා ගාස්තු | 11,279,538 | 3,438,550 |
| LDO ඉඩම් සහ බණිජ බද්ද | 4,630,300 | 4,621,500 |
| දඩ මගින් ආදායම් | 12,182,105 | 11,862,249 |
| මැණික් වෙන්දේසි බලපත්‍ර | 924,248 | 638,200 |
| මැණික් පරීක්ෂා කිරීමේ ගාස්තු | 12,672,514 | 7,310,998 |
| තත්ත්ව මුද්‍රා කාර්යාලයේ ආදායම් | 3,535,422 | 4,014,743 |
| බලපත්‍ර පිටපත් ගාස්තු | 138,780 | 98,200 |
| කටුනායක දියමන්ති මධ්‍යස්ථානයේ සේවා ගාස්තු | 8,965,237 | 10,224,552 |

| | | |
|---|---|---|
| මැණික් පාර්සල් නිශ්කාශණයෙන් ආදායම් | 1,549,194 | 1,410,000 |
| විදේශ විනිමය භාර ගැනීමේ බලපත්‍ර | 100 | 293,321 |
| පාරිසරික  ආරක්ෂණය | 101,080 | (452,407) |
| BACO සේවා ගාස්තු | 20,311,166 | 25,185,500 |
| පරීක්ෂණ ගාස්තු | 58,513,809 | 67,172,600 |
| ත්‍රිමාන කාඩ් සහ වර්ණ | 1,933,542 | 1,977,287 |
| මැණික් වෙළදාම | 227,935,818 | 39,697,648 |
| මැණික් ගැරීමේ දඩ | 6,711,750 | 5,102,250 |
| | **590,723.305** | **370,695,500** |

| 29 | **අනිකුත් ආදායම්** | 2014 | 2013 |
|---|---|---|---|
| | විවිධ ආදායම් | 3,427,415 | 1,664,792 |
| | ලෝක වෙළද මධ්‍යස්ථානයේ සහ රත්නපුර වෙළදසැල් | 22,222,597 | 20,385,819 |
| | පොත් අලෙවිය | 8,100 | (1,925) |
| | ලාභාංශ | 540,000 | 1,351,171 |
| | කුලී ආදායම් | 869,650 | 1,194,579 |
| | වෙන්දේසි අයිතම වලින් ලද මුදල් | 46,320 | 1,409,522 |
| | ස්ථාවර වත්කම් අලෙවියෙන් ලද ලාභ | - | 103,034 |
| | රක්ෂණ නියෝජිතායතන වලින් ලද ආදායම් | 430,977 | 342,866 |
| | ස්වර්ණාභරණ අලෙවිය | 274,915 | 183,412 |
| | ලෝක වෙළද මධ්‍යස්ථානයේ යාව ජීව සාමාජික ගාස්තු | 137,210 | - |
| | ලෝක වෙළද මධ්‍යස්ථානයේ සාමාන්‍ය සාමාජික ගාස්තු | (85,499) | 96,906 |
| | | **27,871,684** | **26,730,178** |

| 30 | **පරිපාලන වියදම්** | 2014 | 2013 |
|---|---|---|---|
| | දායක මුදල් | 931,295 | 290,748 |
| | සංග්‍රහ වියදම් - (දේශීය) | 431,673 | 486,853 |
| | දුරකථන ගාස්තු | 5,306,098 | 4,208,361 |
| | තැපැල් හා මුද්දර | 1,028,906 | 992,058 |
| | අන්තර්ජාල ගාස්තු | 620,736 | 247,427 |
| | ටෙලෙක්ස් සහ පැක්ස් ගාස්තු | 81,641 | 74,921 |
| | අධ්‍යක්ෂ මණ්ඩල වියදම් | 813,179 | 620,905 |
| | කුලී | 4,664,456 | 3,520,511 |

| | | |
|---|---|---|
| විදුලිය | 10,122,429 | 9.397,814 |
| වරිපනම් සහ බදු | 893,662 | 919,390 |
| පුවත් පත් සහ වාර සගරා | 177,141 | 92,016 |
| ජල ගාස්තු සහ බදු | 1,016,391 | 957,329 |
| ප්‍රචාරක | 745,180 | 853,070 |
| ප්‍රවාහන | 247,026 | 104,214 |
| රක්ෂණය | 2,806,268 | 2,370,246 |
| නීති වියදම් | 379,792 | 3,668,733 |
| වර්ෂය සදහා විගණන ගාස්තු | 1,250,000 | 500,000 |
| මිනින්දෝරු ගාස්තු | 756,986 | 370,002 |
| කළමනාකාරිත්ව උපදේශක ගාස්තු | 954,988 | 412,100 |
| ගොඩනැගිලි නඩත්තු | 3,703,879 | 4,246,674 |
| උපකරණ නඩත්තු | 2.340,845 | 1,909,240 |
| ආරක්ෂක සේවා | 5,196,008 | 2,459,209 |
| වැඩමුළු සහ පුහුණු (දේශීය) | 2.816,234 | 912,422 |
| වැටලීම් වියදම් | 531,567 | 328,977 |
| සාමාන්‍ය වෙන්දේසි වියදම් | 1,081,441 | 3,056,022 |
| පරිත්‍යාග | - | 1,977,800 |
| පාරිභෝගික වත්කම් | 165.157 | 350,225 |
| කාර්යාල මිලදී ගැනීම් | 2,372,154 | 1,530,931 |
| භාවිත ඉඩම් අයිතියේ ක්‍රමක්ෂය | 2.364 | 2,364 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 1,214,704 | 3,146,415 |
| පරික්ෂණාගාර සැපයුම් | 757,130 | 800,927 |
| පාරිසරික වියදම් | 2.324,646 | 7,183,612 |
| ක්ෂවීම් | 27,371,312 | 25,259,064 |
| අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය | 2058,875 | 208,875 |
| ලෝක වෙළද මධ්‍යස්ථානයේ කුලී | 15,681,325 | 15,844,811 |
| ලෝක වෙළද මධ්‍යස්ථානයේ විදුලිය බිල | 1,692,346 | 1,430,385 |
| ලෝක වෙළද මධ්‍යස්ථානයේ නීතිඥ ගාස්තු | 87,596 | (137,379) |
| 40 වන සංවත්සර වියදම් | 729,650 | - |
| රථ වාහන නඩත්තු | 4,419,448 | 4,213,686 |
| ඉන්ධන සහ තෙල් | 9,341,432 | 8,532,071 |
| ටයර් සහ ටියුබ් | 865,219 | 1,254,082 |
| රථ වාහන රක්ෂණ සහ බලපත්‍ර | 1,144,737 | 1,316,336 |

| | | | |
|---|---|---|---|
| | රථ වාහන නැවතුම් ගාස්තු | 30.240 | 1,425 |
| | රථ වාහන රක්ෂණ වන්දි | (89,122) | (455,201) |
| | පොදු වියදම් | 1,888,365 | 300,415 |
| | ව්‍යාපෘති වියදම් | 15.381,395 | 3,014,321 |
| | තැන්පත් සහ අත්තිකාරම් වල අගය හාණි වීම් සඳහා වෙන්කිරීම් | | - |
| | නීති ගෙවීම් සඳහා වෙන්කිරීම් | - | 3,400,000 |
| | බැංකු ගාස්තු | 253,765 | 224,869 |
| | ඉල්ලුම් නොකල ජාතිය ගොඩනැගීමේ බදු | 627,948 | 823,428 |
| | බොල්ණය | - | 1,404,560 |
| | පර්යේෂණ හා සංවර්ධන | 780,790 | - |
| | දේපළ, පිරියත හා උපකරණ හාණි පාඩු සඳහා වෙන්කිරීම් | - | 1,952,934 |
| | | **136,149,399** | **126,580,200** |
| 31 | **සේවක වියදම්** | | |
| | වේතන සහ දීමනා | 78,222.833 | 66,368,517 |
| | වැඩ බැලීමේ දීමනා/අවධානම් දීමනා | 718,611 | 505,234 |
| | සේවක අර්ථ සාධක යටතට නොගැනෙන වේතන | 13.691,240 | 8,873,808 |
| | සේවක අර්ථ සාධක අරමුදල | 12,425,913 | 11,091,742 |
| | සේවක භාරකාර අරමුදල | 2,502,195 | 2,134,731 |
| | අතිකාල | 3,751,131 | 3,530,029 |
| | නිවාඩු දින වැඩකිරීම සඳහා ගෙවීම | 162,775 | 179,213 |
| | ත්‍යාග (රන් පදක්කම්) | 221,623 | - |
| | නිවාඩු ප්‍රසාද දීමනා | 4,611.375 | 3,907,869 |
| | සේවක නිවාස ණය පොලී ගෙවීම් | 213,894 | 293,826 |
| | සේවක දිරි දීමනා | 24,131,405 | 7,525,008 |
| | පාරිතෝෂික | 8,259,512 | 8,115,151 |
| | ගමන් වියදම් (දේශීය) | 2,226,992 | 2,104,513 |
| | කාර්ය මණ්ඩල නිල ඇඳුම් | 246.345 | 222,168 |
| | සේවක සුභ සාධන | 7.311.575 | 5,528,905 |
| | කම්කරු වන්දි | 241,233 | 246,300 |
| | වෛද්‍ය ගාස්තු | 5.559,197 | 4,216,211 |
| | ප්‍රවාහන දීමනා | 7,836,900 | 5,228,000 |
| | | **172,334,751** | **130,071,227** |

| | | | |
|---|---|---|---|
| 32 | **ප්‍රවර්ධන වියදම්** | | |
| | ගමන් වියදම් ( විදේශීය) | 11,233,535 | - |
| | ප්‍රදර්ශන වියදම් ( දේශීය) | 29.398,234 | 14,049,238 |
| | ප්‍රදර්ශන වියදම් ( විදේශීය) | 9.700,643 | 10,173,420 |
| | ප්‍රචාරණය ( දේශීය) | 4,377.974 | 4,858,957 |
| | අනිකුත් | 1,678,530 | 1,726,131 |
| | | **56,388,916** | **30,807,746** |
| 33 | **ශුද්ධ මූල්‍ය ආදායම්** | | 2013 |
| | **පොලී ආදායම්** | | |
| | ස්ථාවර තැන්පත් සහ භාණ්ඩාගාර බිල්පත් මත පොලී | 60,761,139 | 109,662,052 |
| | සේවක ණය පොලී | 483,937 | 479,945 |
| | | **61,245,077** | **110,141,997** |
| | **පොලී වියදම්** | | |
| | කල් බදු ගෙවීම් බැරකම් මත වූ මූල්‍ය පිරිවැය | (24,765) | (24,500) |
| | | **(24.765)** | (24,500) |
| | | **61,220,312** | **110,117,497** |

| | | | |
|---|---|---|---|
| 34 | **ආදායම් බදු වියදම්** | 2014 | 2013 |
| | වර්තමාන බදු වියදම් | 146,716.514 | 58,691,033 |
| | පසුගිය වසර සදහා (ඌණ)/ අධි වෙන්කිරීම් මත ගැලපීම් | | - |
| | විලම්භිත බදු ගාස්තු/ (වෙනස් කිරීම්) | (1.368,972) | 2,230,123 |
| | | **145,347,542** | **60,921,156** |

**34.1 වර්තන බදු වියදම් සහ ගිණුම් ලාභ ඉපයීම්**

| | | |
|---|---|---|
| **අතර සැසදීම්** | | |
| බදු වලට පෙර ගිණුම් ලාභ | **314,942,235** | **120,084,001** |
| ඉඩ නොදෙන අයිතමයන් එකතුව | 45,902,450 | 146,720,857 |
| ඉඩ දිය හැකි අයිතමයන් එකතුව | (31,959,862) | (26,491,622) |
| අනිකුත් ප්‍රභවයන්ගෙන් ආදායම් | (84,877,320) | (143,825,087 |
| වෙළද හෝ ව්‍යාපාරික කටයුතු වලින් ලාභ/ (පාඩු) | **244,007,503** | **96,488,149** |
| බදු සදහා අදාල අනිකුත් ආදායම් - පොලී ආදායම් | 84,337,320 | 141,563,392 |

| | | |
|---|---|---|
| **එකතු ව්‍යවස්ථාපිත ආදායම්** | **328,344,823** | **238,051,541** |
| සුදුසුකම් ලබන ගෙවීම් | - | (101,525,000) |
| බදු පාඩු උපයෝජනය | (4,625,990) | - |
| **තක්සේරු ගත ආදායම්/ බදු අයකල හැකි ආදායම්** | **323,718,833** | **136,526,541** |
| ව්‍යවස්ථාපිත බදු රේටයවූ 28% මත බදු ගාස්තු | 90,641,273 | 38,227,431 |
| දළ ලාභාංශ මත බදු | 56,075,241 | 20,463,602 |
| වර්ෂය සඳහා සාමන්‍ය කටයුතු මත වර්තන බදු | **146.716,514** | **58,691,033** |
| **බදු පාඩු** | | |
| ඉදිරියට ගෙනා පාඩු | **-** | **86,240,991** |
| ඇතුලත්වූ පාඩු | - | - |
| උපයෝජනය කල පාඩු | - | (86,240,991) |
| **ඉදිරියට ගෙනයන පාඩු** | **-** | **-** |

35. **ප්‍රාග්ධන සහ අනිකුත් බැදීම්**

වාර්තාකරණ කාල පරිච්ජේදය තුල ප්‍රමාණාත්මක ප්‍රාග්ධන වියදම් හෝ අනිකුත් මූල්‍ය බැදීම් කිසිවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නොමැත.

36. **වාර්තාකරණ කාල පරිච්ජේදයට පසු ඇතිවන සිදුවීම්**

වාර්තා කරනු ලබන දෙසැම්බර් 31 දින සහ ගිණුම් අත්සන් කරන කාල පරිච්ජේදය තුල ගැලපීම් සිදුකිරීමට හෝ හෙළිදරව් කිරීමට කාල පරිච්ජේදයට පසු ඇතිවන සිදුවීම් නොමැත.

37. **අසම්භාව්‍ය බැරකම්**

අධිකාරියෙහි සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු හේතුවෙන් පැන නගිනු ලබන නිත්‍යානුකූල අසම්භාව්‍ය බැරකම් ඇත. වෙන්කිරීම් ලෙස හදුනාගෙන දක්වා තිබේනම් (සටහන් 27), එම බැදීම් පියවා ඉවත් කිරීමේදී සම්පත් ඉවතට ගලායාම සහ එය සාධාරණීකරනය කලහැකි නම් කළමණාකාරීත්වය එය සැලකිල්ලට ගනු ලැබේ. අධිකාරියෙහි නීති අංශයේ නීති උපදෙස් මත මෙම ගණනය කිරීම් රදා පවතිනු ඇත.

38. **සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම**

අධිකාරියෙහි සම්බන්ධිත පාර්ශවයන් මහා භාණ්ඩාගාරය, රජයට සම්බන්ධිත ආයතන, රජයට අයත් ව්‍යාපාරික ආයතන සහ ප්‍රධාන කළමණාකාරිත්වයේ පුද්ගලයින් ගෙන් සමන්විත වේ.

38.1 **ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන් හා සිදුවූ ගණු දෙණු**

ශ්‍රී ලංකා ගිණුම්කරණප්‍රමිත 24 අනුව " සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම " ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන්හට කෙලින්ම හෝ වක්‍රව ආයතනයේ කටයුතු සැලසුම් කිරීම, මගපෙන්වීම්, පාලනය කිරීම් පිළිබඳ වගකීම පැවරී ඇත. ඒ අනුව ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන් අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස වර්ගීකරණය කෙරේ.

| ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන්සමග සිදුවූ ගණුදෙණු | 2014 | 2013 |
|---|---|---|
| පාරිශ්‍රමික සහ අනෙකුත් කෙටි කාලීන සේවක ප්‍රතිලාභ | 813,179 | 2,011,950 |
| සේවා කාලයෙන් පසු ප්‍රතිලාභ | | 20,056 |

38.2 **සම්බන්ධිත පාර්ශවයන් හා ගණුදෙණු**

**අධිකාරිය විසින් සම්බන්ධිත පාර්ශවයන් හා සිදුකරන ලද ගණුදෙණු පිළිබඳ වැදගත් තොරතුරු පහත දක්වා ඇත.**

| **සම්බන්ධිත පාර්ශවය** | වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදය සඳහා කරන ලද ගණුදෙණුවල ස්වභාවය | ගණුදෙණුවේ වටිනාකම | ශේෂය (ගෙවිය යතු/ ලැබිය යුතු) |
|---|---|---|---|
| රජයට අයිති ව්‍යාපාරික ආයතන | ස්ථාවර සහතික වල සහ භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය | 1,242,362,761 | |
| | ස්ථාවර සහතික සහ භාණ්ඩාගාර බිල්පත් ආපසු ගැනීම් | (20,000,000) | 1,222,362,761 |
| | ආපසු මිලදී ගතහැකි ආයෝජන (REPO) | 10,000,000 | |
| | ආපසු මිලදී ගතහැකි ආයෝජන (REPO) ආපසු ගැනීම් | - | 10,000,000 |
| අනිකුත් රජය හා සම්බන්ධිත ආයතන | කොටස්වල ආයෝජනය | 1,200,010 | 1,200.010 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } විඑම්/ජේ/එන්ජීජේ/1/14/1 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 ජූලි 24 දින

සභාපති,

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 21(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරිම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයිම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

-------------------------------

වසර 3 ක කල්පිරීම් කාලයක් සහිත රු 20,000,000 ක් වූ ස්ථාවර තැන්පතු දෙකක් ආයෝජන වත්කම් ලෙස ගිණුම්වල දක්වනු වෙනුවට ජංගම වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

------------------------------

(i) සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු රු. 31,300,527 ක් වූ වාහන 14 ක් ආයතනය විසින් තවදුරටත් ප්‍රයෝජනයට ගන්නා නමුත් මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කර නොතිබුණි.

(ii) වත්කම් ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට පත්කළ දින සිට ක්ෂය කළ යුතු වුවත් වත්කම් සඳහා මුදල් ගෙවූ දින සිට ක්ෂය කිරීම නිසා නියැදි පරීක්ෂණයට අනුව වත්කම් අයිතම් 5 ක් රු.111,015 ක් වැඩියෙන් ක්ෂය කර තිබුණි.එසේම 2010 වර්ෂයේදී මිලට ගෙන තිබූ පිරිවැය රු. 8,803,881 ක මෝටර් රථයක් 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ක්ෂය කර නොතිබුණි. එම නිසා මෙම රථයේ සමුච්චිත ක්ෂය වෙන්කිරීම රු 4,401,939 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මැණික් වෙන්දේසිවලදී අධිකාරිය එකතුකරගත් සියයට 2.5 ක බදු මුදල්වලින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබූ රු 8,714,800 ක මුදල ලැබිය යුතු රඳවාගැනීම් බදු ගිණුමට ( WHT Receivable ) හර කර තිබුණි.එම නිසා ලැබිය යුතු රඳවාගැනීම් බදු ගිණුමේ ශේෂය ඉහත ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ආ) ස්ථාවර තැන්පතු ගිණුම් 11 ක හා භාණ්ඩාගාර බිල්පත් 5 ක ආයෝජනය කර තිබුණු රු. මිලියන 861.3 ක ආයෝජන සඳහා ලැබිය යුතු පොළිය රු. 14,029,773 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොළිය වූ රු 8,496,216 ක මුදල වෙන වෙනම අදාල ගිණුම්වලට හර කරනු වෙනුවට මුළු මුදලම භාණ්ඩාගාර බිල්පත් ගිණුමට හර කර තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් කාර්තුව සඳහා ලැබිය යුතු රු. 53,317 ක කොමිස් ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) රු. 4,299,688 ක් වූ ගොඩනැගිලි කාමර වෙන්කිරීම් වෙනම වර්ගීකරණය නොකර ගොඩනැගිලි යටතේ පෙන්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මාස 4ක කාලයක් සඳහා ගෙවා තිබුණු රු. 234,149 ක් වූ ගෙවුඩ ප්‍රවාහන රක්ෂණ වියදම රක්ෂණ ආදායමින් අඩුකර නොතිබීමත්, සමාලෝචිත වර්ෂයේ අවසන් කාර්තුව සඳහා වූ රු. 171,732 ක ගෙවිය යුතු රක්ෂණ වියදම ගිණුම් ගත නොකිරීමත් නිසා වර්ෂයේ රක්ෂණ ආදායම රු. 405,881 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(උ) නාවුල හා මොණරාගල ප්‍රාදේශීය කාර්යාල වැඩිදියුණු කිරීම වෙනුවෙන් රු. 5,015,179 ක අත්තිකාරමක් ගෙවා තිබුණි. එම ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු නිමානොවී පැවතියදී ගෙවූ අත්තිකාරම් මුදලට සමාන මුදලක් වැරදි සහගත ලෙස ප්‍රාග්ධනිත කර තිබූ අතර, එම මුදලම තවදුරටත් ගෙවිය යුතු මුදලක් ලෙසත් ගිණුම්ගත කර තිබුණි.

**2.2.3 නොසැසඳූ පාලන ගිණුම්**

-------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු එකතුව රු.171,474,206 ක් වූ පාලන ගිණුම් 05ක් ඊට අදාල උප වාර්තා සමඟ සසදා නොතිබුණු බැවින් රු.3,100,308 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් නොවීම**

---------------------------------------------

චීනයේ ෂැංහයි නුවර පවත්වා තිබුණු වෙළඳ ප්‍රදර්ශනයක,වෙළඳ කුටි ඉදිකිරීම සඳහා වූ රු. 3,580,000 ක වියදමට අදාළ කොන්ත්‍රාත් ගිවිසුම, බිල්පත් සහ සැලසුම් පිටපත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2.3 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන රු. 482,639,856 මුදලක් භාණ්ඩාගාර බිල්පත්වල හා රු. 739,722,904 ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (ආ) 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පනතේ 18(1) වගන්තිය | රජයේ ඉඩමක හෝ පතල් කැපීමේ හෝ මැණික් ගැරීමේ අයිතිවාසිකම් රජය වෙත ඇත්තා වූ ඉඩමක මැණික් ගැරීමේ අයිතිවාසිකම් ඇති තැනැත්තා විසින් එම ඉඩමෙන් ලැබෙන මැණික් වෙනුවෙන් රාජ්‍ය භාගයක් ගෙවිය යුතු වුවත් අධිකාරිය විසින් සිදුකර තිබූ මැණික් ගැරීම් ව්‍යාපෘතිවලින් ලද මැණික්වල විකුණුම් වටිනාකමින් කිසිදු රාජ්‍ය භාග මුදලක් මහා භාණ්ඩාගාරය වෙත ගෙවා නොතිබුණි. තවද රාජ්‍ය භාග ප්‍රතිශත සම්බන්ධ නියමයන් ගැසට් නිවේදන මඟින් ප්‍රකාශයට පත්කර නොතිබුණි. |

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ

(i) II පරිච්ඡේදයේ 13.3වගන්තිය

වැඩ බැලීම් / රාජකාරී ඉටුකිරීම් තනතුරකට පත්කළ යුත්තේ නිත්‍ය තනතුරට පත්කරන තෙක් තාවකාලික පදනමක් මතය. නමුත් 2012 ජූලි 28 දින සිට පුරප්පාඩුව පැවති ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා ස්ථිරව නිළධාරියෙකු පත්කිරීමට කටයුතු නොකර මෙම වාර්තාවේ දිනය දක්වා වසර දෙක හමාරකට අධික කාලයක් අදාළ තනතුරේ වැඩ ආවරණය කරමින් පැවතුණි.

(ii) VII පරිච්ඡේදයේ 4 වගන්තිය

සේවක අන්තර්ග්‍රහණයේදී නව වැටුප් කේතයන්හි ඉදිරි වැටුප් පියවරයන්වල මෙන්ම සිටින වැටුප් කේතයෙහිම වැටුප් පියවරයන් කිහිපයක් ඉදිරියෙන් පිහිටවා සේවකයින් අන්තර්ග්‍රහණය කර තිබීම නිසා නිළධාරීන් 10 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී රු. 390,870 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(iii) xii පරිච්ඡේදයේ 23.1 වගන්තිය

අධිකාරියේ සේවයේ නියුතු තක්සේරු නිළධාරියෙකු අනුමැතියකින් තොරව 2012 වර්ෂයේ නොවැම්බර් සිට 2014 වර්ෂයේ නොවැම්බර් කාලය තුළදී අවස්ථා තුනකදී විදේශ ගත වී තිබූ අතර අනුමැතිය ලබා තිබුණු අවස්ථා වලදී අවස්ථා දෙකකදී අනුමත කාල සීමාව ඉක්මවා විදේශගතව සිට පැමිණ තිබුණි.මෙහිදි එක් විදේශ ගමනක් සඳහා ඇ.ඩො. 3,960 ක ( රු. 518,760 ක් පමණ) දීමනාවක් ගෙවා තිබුණි.

| | |
|---|---|
| (ඇ) 2014 නොවැම්බර් 21 දිනැති අංක 05/2014 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 01 ඡේදයේ 2 වගන්තිය | සේවකයෙකුට ගෙවිය හැකි ප්‍රසාද දීමනා මුදල වූ රු. 13,500 ක මුදල ඉක්මවා අධිකාරිය විසින් සේවකයෙකුට රු. 50,000 බැගින් සමාලෝචිත වර්ෂයේදී ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. මේ අනුව චක්‍රලේඛ නියමය ඉක්මවා ගෙවා තිබුණු මුළු මුදල රු. 8,504,500 ක් විය. |
| (ඉ) 2009 දෙසැම්බර් 02 දිනැති රාජ්‍ය අංශයේ තොරතුරු තාක්ෂණ භාවිතය සඳහා වන ප්‍රතිපත්ති සහ කාර්යපටිපාටි සංග්‍රහයේ ( ඉ - රාජ්‍ය ප්‍රතිපත්තිය ) 4 වන කොටස: | |
| (i) 040102 වගන්තිය | සියළුම නිල ඉලෙක්ට්‍රොනික සන්නිවේදන සඳහා නිල ඉලෙක්ට්‍රොනික තැපැල් ලිපිනයන් යොදාගත යුතු වුවත් අධිකාරියේ අපනයන ප්‍රවර්ධන අංශය විසින් විදේශ ප්‍රදර්ශන සංවිධානය කිරීමේදී පෞද්ගලික ඉලෙක්ට්‍රොනික තැපැල් ලිපිනයන් භාවිතා කර තිබුණි. |
| (ii) 040111 වගන්තිය | ආයතනික නිල ඉලෙක්ට්‍රොනික තැපැල් පණිවිඩවල නිළධාරියාගේ නම, තනතුර හා ආයතනයේ නම සහිතව සම්මත නිල අත්සනක් අඩංගු විය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) | 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 1.1.6 ( V) වගන්තිය | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව අධිකාරියේ අධ්‍යක්ෂ ( අපනයන හා අපනයන අලෙවි ) වෙත නිල වාහනයක් අනුයුක්ත කර තිබූ අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී ප්‍රවාහන හා ඉන්ධන දීමනා වෙනුවෙන් 591,180 ක මුදලක් ගෙවා තිබුණි. එසේම හදිසි නිල රාජකාරී සඳහා පමණක් අදාළ නිළධාරින්ට වාහන පැදවිය හැකි වුවත් අධිකාරියේ නිළධාරීන් නිරන්තරයෙන් වාහනය තමන් විසින්ම පදවන අතර රාත්‍රී කාලයේ සිය නිවේස්වල වාහන ගාල් කරමින් පැවතුණි. |
| (උ) | 2010 ඔක්තෝබර් 11 දිනැති අංක 01/2010/01 දරන මුදල් ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 6 ඡේදය | විදේශ ප්‍රදර්ශන සඳහා සහභාගි වූ නිළධාරීන්ට නියමිත සංයුක්ත දීමනාව ඉක්මවා රු. 769,560 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඌ) | 2011 ජනවාරි 27 දිනැති අංක පීඊඩී 56 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ඉදිරි 6 මාසයක කාලයක් සඳහා වන කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් මුදලක් තබාගෙන ඉතිරි සියලු අතිරික්ත මුදල් ඒකාබද්ධ අරමුදලට මාරු කල යුතු වුවත් අධිකාරිය එසේ සිදුකර නොතිබුණි. |

### 2.4 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

සමාලෝචිත වර්ෂය සඳහා දිරිදීමනා ගෙවීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පමණක් පදනම් කරගෙන සියළු සේවකයින්ට මාස දෙකක දළ වැටුපට සමාන මුළු වියදම රු. 12,481,405 ක මුදලක් දිරිදීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. තවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ඉතිරි කරගත් නිවාඩු වෙනුවෙන් අධිකාරියේ සියලුම සේවකයින්ට රු. 4,611,375 ක මුදලක්ද ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය බදුවලට පෙර රු 314,942,235 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු 120,084,002 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 194,858,233 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මැණික් විකිණීම ආදායම සහ අපනයන සේවා ගාස්තු රු. මිලියන 217 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ ලාභය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 194,858,233 කින් හෙවත් සියයට 162 කින් වර්ධනය වී තිබුණු අතර 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ ලාභය රු. 230,844,298 කින් හෙවත් සියයට 830 කින් වර්ධනය වී තිබුණි. පිළිවෙලින් සීතාවක ගහ නියමු ව්‍යාපෘතියෙන් සහ කතරගම මැණික් ඉඩම් වෙන්දේසියෙන් ලද ආදායම් ඉහත කැපී පෙනෙන වර්ධනයන්ට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3.3 වියදම්වල අසාමාන්‍ය වැඩිවීම්

ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැය විෂයන් 9 කට අදාල වියදම රු.40,158,415 කින් අසාමාන්‍ය ලෙස වැඩිවී තිබුණු අතර එම වියදම්වල වැඩිවීමේ ප්‍රතිශතය සියයට 32 සිට සියයට 529 දක්වා වූ පරාසයක විය. මෙම වියදම් වලින් අධිකාරියේ ආදායම් ඉපයීම සඳහා සෘජුව දායක වී තිබුණේ රු.1,587,951 කින් හෙවත් සියයට 529 කින් ඉහළ ගොස් තිබුණු ගංගා ආශ්‍රිත මැණික් සෙවීමේ ව්‍යාපෘති ආරම්භ කිරීමේ වියදම පමණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2005 වර්ෂයේ සිට අපනයන සේවා ගාස්තු ආදායමෙන් අය කර තිබූ මුදලින් අරමුදලක් පිහිටුවා තිබූ අතර එකී අරමුදලින් රසායනාගාරයක් ඉදිකිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත 2009 වර්ෂයේදී රු. 92,948,578 ක මුදලක් ලබාදී තිබුණි. 2015 මැයි වන විටද එම රසායනාගාරය පිහිටුවා නොතිබූ අතර මෙකී මුදල් එම ආයතනය විසින් 2009 සිට ආයෝජනය කිරීමෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු. මිලියන 42 කට අධික පොළියක් උපයාගෙන තිබූ අතර එකී පොළී ආදායම අධිකාරියට අහිමි වී තිබුණි.

(ආ) අධිකාරිය විසින් අයකරන බලපත්‍ර ගාස්තු, අපනයන සේවා ගාස්තු, මැණික් හා ස්වර්ණාභරණ පරීක්ෂණ ගාස්තු යනාදි ගාස්තු සම්බන්ධයෙන් ගැසට් නිවේදනයන් ප්‍රසිද්ධ කර මහජනයා දැනුවත් කර නොතිබුණි.

(ඈ) බලපත්‍ර නිකුත්කිරීම් සම්බන්ධයෙන් වන බොහොමයක් නඩු සඳහා නඩු නිමිති වී තිබුනේ අභියාචනා සම්බන්ධයෙන් ආයතනය හා අමාත්‍යාංශය ලබාදෙන තීරණ පරස්පර විරෝධී වීම, අභියාචනයක් තිබියදී වෙනත් පාර්ශවයකට බලපත්‍රයක් නිකුත්කිරීම,බෙදුම්නඩු පවතින ඉඩම්වලට මැණික් කැපීමේ බලපත්‍ර නිකුත්කිරීම වැනි කරුණු වේ. මෙම ගැටළු අවමකර ගැනීමට ආයතනය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.ආයතනයේ ප්‍රතිපත්තිවල දුර්වලතාවයක් නිසා සමාලෝචිත වර්ෂය අවසානයට ඉහත කරුණු සම්බන්ධව පවරා තිබුණු නඩු 3 ක් සඳහා නීති ගාස්තු ලෙස රු. 90,410 ක් වැයකර තිබුණි.

(ඈ) විදේශ ප්‍රදර්ශනවලදී ප්‍රදර්ශන කුටිවල මිල තීරණය කිරීම පිළිබඳව යෝග්‍ය මිල ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබුණි. මෙම හේතුව නිසා ප්‍රදර්ශනවලට සහභාගිවන ප්‍රදර්ශකයින්ගෙන් අධිකාරියට චෝදනා එල්ල වී තිබුණි. උදා- සමාලෝචිත වර්ෂයේ මැයි මසදී පවත්වා තිබූ ෂැංහයි මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය.

## 4.2 කාර්යය මණ්ඩල කළමනාකරණය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ අංශ අනුව යොදවා ඇති තථ්‍ය කාර්ය මණ්ඩලය ( කොන්ත්‍රාත් පදනම ඇතුළත්ව) සමඟ අනුමත කාර්ය මණ්ඩලය සැසඳීමේදී 53 ක සේවක අතිරික්තයක් නිරීක්ෂණය විය.

(ආ) අධ්‍යක්ෂ ජනරාල් හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් යන ප්‍රධාන කළමනාකරණ තනතුරු සඳහා වර්ෂ 2 කට වැඩි කාලයක් වැඩ බැලීමේ පදනම මත නිළධාරීන් පත් කර තිබුණද,ස්ථිරව නිළධාරීන් පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අධ්‍යක්ෂ ( අපනයන සේවා හා අපනයන අලෙවි ) තනතුර සඳහා බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවා ඒ සඳහා 2014 ජනවාරි 03 දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වා තිබූ අතර එහිදී මූලික සුදුසුකම් සපුරා තිබූ අයදුම්කරුවන් තිදෙනෙකු සිටියදී මූලික සුදුසුකම් සපුරා නොතිබූ හා වයස් සීමාව ඉක්මවූ නිළධාරියෙකු බඳවාගෙන එවි. එම 1 1 වැටුප් කේතයෙහි පිහිටුවා වැටුප් හා දීමනා ලෙස ( ඉන්ධන හා ප්‍රවාහන දීමනා හැර ) රු. 653,918 ක් ගෙවා තිබුණි. මෙම නිළධාරියා පෞද්ගලික ආයතනයක පූර්ණ කාලීන අධ්‍යක්ෂවරයෙකු බවද අනාවරණය විය.

(ඇ) සම්මුඛ පරීක්ෂණයක් මඟින් සේවකයින් අභ්‍යන්තරව බඳවාගැනීමේදී අනුමත බඳවාගැනීමේ පරිපාටියට අනුව සපුරා තිබිය යුතු අවම සුදුසුකම් හා පලපුරුද්ද සපුරා නොතිබුණු නිළධාරීන් දෙදෙනෙකු සහකාර අධ්‍යක්ෂ තනතුරු දෙකක් සඳහා බඳවාගෙන තිබුණි.

(ඉ) ආයතනයේ ලේකම් ධූරය සඳහා සුදුසුකම් ලත් නිළධාරීන් දෙදෙනෙකු සිටියදී පෞද්ගලික ආයතනයකින් එම කාර්යය ඉටුකර ගෙන තිබුණි. ආයතනයේ ස්ථිර නිළධාරියකු මෙම කර්තව්‍ය සඳහා පත් නොකිරීම නිසා අධිකාරියේ අභ්‍යන්තර තොරතුරුවල රහස්‍යභාවය සුරැකීමේ වගකීම පිළිබඳ ගැටලු සහගත තත්ත්වයක් ඇති විය හැකි බව නිරීක්ෂණය විය.

(ඊ) විශ්‍රාමිකයින් නැවත සේවයේ යොදවාගැනීම

(i) වයස අවුරුදු 60 ඉක්මවූ නිළධාරියෙකු 2012 ඔක්තෝම්බර් සිට පාලක මණ්ඩලයේ අනුමැතිය මත පමණක් කොන්ත්‍රාත් පදනම යටතේ උපදේශකවරයෙකු ලෙස බඳවාගෙන තිබුණි . ඒ වෙනුවෙන් මාසික දීමනාව සහ අනෙකුත් දිරිදීමනා වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 937,143 ක්ද 2013 වර්ෂයේදී රු. 796,000 ක මුදලක්ද ගෙවා තිබුණි.

(ii) සහකාර තක්සේරුකරු ( රත්න විද්‍යා ) විශ්‍රාම ගැනීමෙන් පසුව නැවත කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඒ වෙනුවෙන් මාසික දීමනාව සහ අනෙකුත් දිරිදීමනා වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 338,633 ක්ද 2013 වර්ෂයේදී රු. 568,334 ක මුදලක්ද ගෙවා තිබුණි.

(උ) නීති නිලධාරි තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති නිලධාරියෙකු අධිකාරියේ සිටියදී එම නිලධාරිනිය වෙනත් තනතුරක් සඳහා අනුයුක්ත කර නීති අංශය සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරින් තිදෙනෙකු බඳවාගෙන තිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සීතාවක ගඟ පර්යේෂණ නියමු ව්‍යාපෘතියෙන් ලැබී තිබුණු මැණික් වෙන්දේසි ආදායමින් රු. 17,480,000 ක් වැය කර අඩු ආදායම් ලාභී පවුල් 437 ක් සඳහා රු 40,000 ක දීමනාවක් අදාළ පවුල්වලට ගෙවා තිබුණි. මෙකී වියදම ආයතනයේ අරමුණුවලට පටහැනි ගෙවීමක් වන අතර දීමනා ලබාදෙන ලද පවුල් හඳුනාගත් ආකාරය විගණනයේදී මතභේදයට තුඩු දෙන කරුණක් විය .

(ආ) හෘද සැත්කමකට භාජනය කර තිබුණු නිළධාරියෙකු සාවද්‍ය ලෙස සේවයට වාර්තා කළ බවට කරුණු දක්වා සමාලෝචිත වර්ෂය සඳහා දිරිදීමනා මුදල් ලෙස රු. 281,152 ක් ලබාගෙන තිබුණි.

## 4.4 හඳුනාගන්නා ලද පාඩු

------------------------

කපා ඔපදැමූ මැණික් අපනයනය කිරීමේ විශේෂ ව්‍යාපෘතිය ( NSS ) යටතේ සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 2,990 ක පමණ මැණික් අපනයනය වී තිබූ බවට අපනයන ඉන්වොයිස් මඟින් අනාවරණය විය. එම අපනයන මත අධිකාරිය උපයා තිබූ සේවා ගාස්තු ආදායම රු. 7,915,142 ක් වූ අතර මෙම ව්‍යාපෘතියෙන් බැහැරව සාමාන්‍ය පරිදි මැණික් අපනයනය කළේ නම් අධිකාරියට අවම වශයෙන් රු. 14,950,186 ක ආදායමක් ඉපයීමට හැකියාව තිබුණි. මේ අනුව අධිකාරියට රු. 7,035,044 ක පමණ ආදායමක් අහිමි වී තිබුණු බව නිරීක්ෂණය විය.මෙම ව්‍යාපෘතියට අදාළ නීති රීති ගැසට් නිවේදන මඟින් නීති ගත කර නොතිබුණි.

## 4.5 දූශ්‍ය අක්‍රමිකතා

--------------------

පොළී ආදායම් මත 2013/2014 වර්ෂය සඳහා ආදායම් බදු ගෙවීමේදි රඳවාගැනීම් බදු සහනය හා නාමික බදු සහනය ලෙස රු.8,642,300 ක් ලබාගෙන තිබුණද පොළී ආදායම් ගිණුමට රු. 3,017,709 ක් පමණක් බැර කර තිබීම හේතුවෙන් ගෙවා තිබූ ආදායම් බද්ද රු 1,574,885 කින් අඩු වී තිබුණි.

## 4.6 ප්‍රමාද වූ ව්‍යාපෘති

-----------------

ස්වර්ණාභරණ සංවර්ධන අරමුදලේ මුදල්වලින් රු. මිලියන 12 ක් යොදා ගෙන ස්වර්ණාභරණ ශිල්පීන් සඳහා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් 2011 වර්ෂයේදී අනුමැතිය ලැබී තිබුණි. නමුත් මේ යටතේ අනුමත වැඩසටහන් වලින් ශිල්පීන්ට සහන මිලට රන්රිදී ලබාදීම,ස්වර්ණාභරණ ශිල්පීන් සඳහා ණය සහන අරමුදලක් පිහිටවීම,ශිල්පීන් සඳහා ඉංග්‍රිසි දැනුම/විදේශ තාක්ෂණික දැනුම ලබාදීම හා දේශිය ජංගම රන්රිදී භාණ්ඩ අලෙවිපොලක් සංවිධානය කිරීම යන කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.තවද අනුමත වැඩසටහන්වල ප්‍රගතිය දැක්වෙන ත්‍රෛමාසික වාර්තා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------------

## 5.1 සංයුක්ත සැලැස්ම

--------------------

1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව ඉටු කළ යුතු කාර්යයන් සියල්ලම සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

-----------------------------------

අයවැයගත තොරතුරු හා තථ්‍ය තොරතුරු අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ අතර අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස යොදවාගෙන නොතිබුණි.

**5.3 නොවිසඳී ඇති විගණන ඡේද**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 ඔක්තෝබර් 09 දිනැති අංක 39 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව අධිකාරියේ නිළධාරීන් දිගින් දිගටම අනුමැතියකින් තොරව අනුමත ඉන්ධන දීමනාව ඉක්මවා ඉන්ධන ලබාගැනීම නිසා 2012 හා 2013 වර්ෂවලදී අධිකාරියට රු. 2,165,852 ක පාඩුවක් සිදු වී තිබුණි.

(ආ) අධ්‍යක්ෂ - මානව සම්පත් හා පරිපාලන තනතුරට බඳවාගැනීමේදී වැටුප් පියවරයන් 8 ක් ඉදිරියෙන් තබා වැටුප් නියම කර තිබූ අතර, ඒ අනුව 2013 වර්ෂයේදී වැටුප් වශයෙන් රු 79,200 ක්ද නිවාඩු දින දීමනා හා දිරි දීමනා ලෙස රු. 36,844 ක්ද වැඩිපුර ගෙවා තිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) ප්‍රවාහන ඇණිය
(ඇ) මානව සම්පත් කළමනාකරණය
(ඇ) විදේශ වෙළඳ ප්‍රදර්ශන සංවිධානය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)